ශ්‍රී ලංකා... 

# රසඳුන

කලා ලොව රස කලස

2023 පෙබරවාරි 12



පිටුව 07

අවුරුදු කුමරිය ලෙස තේරුණු නිසයි

## මගෙ හීනයට යන පාර හැදුණේ

සචින්ත්‍යා අරුන්දතී

පිටුව 08-09

## ආදරේ නොකියාම

අපි විවාහ වුණා

නිත්‍යා දේවින්දි

පිටුව 12-13

## තාත්තා වගේම මමත්

පොළොවේ පය ගහලා ජීවත් වෙන කෙනෙක්

ඉෂාරා අතුකෝරල

ඩිශානි නෙහාරා

ඡායාරූපය
ඉන්දික මල්ලවආරච්චි





තරගය ජයගත්තට ලැබුණේ දවස් 21ක ඉන්දියානු සංචාරයක්

# මට ලැබුණේ සම්මානයක් නොවෙයි
# විශේෂ වරප්‍රසාදයක්

▶ නාමලී ගමගේ

**රාගධාරී සංගීතයට උපන් හපන්කම් කියන ජාත්‍යන්තර ජයග්‍රහණයක් හිමිකර ගත් රියැලිටි තරුවක් ගැනයි අද අප ඔබට හඳුන්වා දෙන්නේ. පවුල් පසුබිම ද ඔහුගේ මේ ගමන් මඟට රතු පළසක් වූ බව නම් පැහැදිලිය. කලා පවුලකින් පැවත එන ඔහු තනුර මධුගීත්ය. ඔහුගේ කරළියට පිවිසීම සිදුවන්නේ 2021 දෙරණ ඩ්‍රීම් ස්ටාර් කිරුළේ හිමිකරුවා වීමත් සමඟිනි.**

**●මොකක්ද තනුර මේ ඔබේ ජාත්‍යන්තර ජයග්‍රහණය?**

මේක සංස්කෘතික සබඳතා පිළිබඳ ඉන්දියානු කවුන්සලය මඟින් ප්‍රථම වරට සංවිධානය කළ තරගාවලියක්. ඒක නම් කරලා තිබුණේ 'ප්‍රතිභා සංගම්' කියලා. ගායන, වාදන, නර්තන යන අංශ තුනෙන්ම තරග වදින්න අවස්ථාව තිබුණා. ගායනයෙන් හින්දුස්ථානි, කර්ණාටක අංශ, නර්තනයෙන් භරත නාට්‍යම්, කථක්, ඔඩිසි අංශ වගේම වාදනයෙන් තබ්ලා, බටනළා, නාදස්වරම් යන අංශවලින් තරග වදින්න තිබුණේ. ගායන අංශයේ හින්දුස්ථානි සහ කර්ණාටක කියන අංශ දෙකෙන් හින්දුස්ථානි කියන අංශයේ පළමු ස්ථානය මට ලැබුණා.

**●තරගාවලිය සඳහා සහභාගි වීමට ඔබ ඉන්දියාවට ගියා ද?**

නැහැ. මේක සම්පූර්ණයෙන්ම ඔන්ලයින් විශේෂාංගය විදිහට පැවැත්වුණේ. අපේ ස්ටුඩියෝ එකක, විනාඩි දහයක වීඩියෝ එකක් විදිහට කරලා එයාලගෙ වෙබ් සයිට් එකකට අප්ලෝඩ් කරන්න තිබුණේ. තරගකරුවන් අවුරුදු 35ට අඩු වෙන්න ඕන. ජයග්‍රාහකයන්ට ඉන්දියානු සංචාරයකට සහභාගි වීමේ අවස්ථාව ලැබෙනවා. ගිය අවුරුද්දේ මැද හරියේ තමයි මේ තරගාවලිය තිබුණේ. නොවැම්බර් තමයි ජයග්‍රහණය ගැන නිල වශයෙන් මට දැනුම් දුන්නේ.

එහිදී මට ලැබුණේ සම්මානයක්ම නොවෙයි. විශේෂ වරප්‍රසාදයක්. ඒ දවස් 21ක ඉන්දියානු සංචාරයක්. එහි විශේෂත්වය තමයි ඒ සංචාරයේ දී අපිට එයාල නියම කරන විශේෂාංග ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලැබෙනවා.





මම තමයි එතැන හිටිය එකම ගායකයා

**●ඔබ සහභාගි වුණු ඉන්දියානු සංචාරය ගැන සඳහන් කළොත්?**

දෙසැම්බර් 26 වැනිදා ගිහින් ජනවාරි 15 වැනිදා තමයි නැවත ආවේ. දින 21ක සංචාරයක් ඒක. තරගාවලියේ ජයග්‍රාහකයන් 14 දෙනෙක් සඳහා සංවිධානය කරලා තිබුණත් 8 දෙනෙක් විතරයි සහභාගි වෙලා තිබුණේ. මැලේෂියා, මොරිසස්, ජපානය වගේම ඉන්දියානුවෝ 3 දෙනෙක් සහභාගි වුණා. සංස්කෘතික සබඳතා පිළිබඳ ඉන්දියානු කවුන්සලයෙන් තමයි සියලු වගකීම් දැරුවේ. සංදර්ශන 10ක් සංවිධානය කරලා තිබුණා. දිල්ලි, චෙන්නායි, ඉන්ඩෝර්, පූනෙයි කියන නගරවල. එහි තිබෙන සංස්කෘතික සබඳතා පිළිබඳ ඉන්දියානු කවුන්සලයේ ශාඛාවලින් තමයි ඒවා සංවිධානය කරලා තිබුණේ. එයාලා නියම කරන ෆෙපෝමන්ස් හැම ස්ටයිල් එකක්ම වගේ හයිලයිට් වෙන විදිහට නර්තනයත් එක්ක ඉදිරිපත් කරන්න ඕන. මම තමයි එතන හිටිය එකම ගායකයා. මට සෝලෝ අයිටම්ස් 4 කට සහභාගි වෙන්න අවස්ථාව ලැබුණා.

**●ඔබ මේ ක්ෂේත්‍රයට එන්නේ රියැලිටි වැඩසටහනකින් නේද?**

ඔව්. 2019 දෙරණ ඩ්‍රීම් ස්ටාර් කිරුළ හිමිවෙන්නේ මට. ඊට පස්සේ තමයි ක්ෂේත්‍රයට කෙළින්ම සම්බන්ධ වෙන්නේ. නමුත් ඊට කලින් මං දෙරණ ලිට්ල් ස්ටාර් තරගාවලියේ 3 වැනි ස්ථානය දිනාගත්තා. ඒ 2009 වසරේ.

**●ඔබ ගොඩනැඟෙන්නේ කලා පවුලකින්. ඔබේ පියා ජනප්‍රිය ගායකයෙන් වගේම වාදකයෙක්. ඒ ගැනත් මතක් කරමු ද?**

මගේ තාත්තා ජයන්ත දිසානායක. ඔහු දක්ෂ සෙක්සෆෝන් වාදන ශිල්පියෙක් වගේම ගායකයෙක්. කෑගල්ල ශාන්ත ජෝසප් බාලිකාවේ වගේම කොළඹ නාලන්දා විද්‍යාලයේත් සංගීත ගුරුවරයෙක්. ඔහුගේ 'සදාදර නයෝ ඔබේ මංගල දිනේ' කියන ගීතය 90 දශකයේ ගොඩක් ජනප්‍රිය වුණු ගීතයක්.

**●ඔබේ අලුත් නිර්මාණ ගැන සඳහන් කළොත්?**

ලතා වල්පොල මහත්මියත් එක්ක ගීතයක් කළා. ඒකෙ ඕඩියෝ එක දැනට අවසන්. වීඩියෝ එක ප්ලෑන් කරමින් ඉන්නේ. ඉතාම ඉක්මනින් ඒක එළිදක්වන්න බලාපොරොත්තුවෙන් ඉන්නේ.

**●ඔබේ ඉදිරි බලාපොරොත්තු මොනවද?**

දැනට මං සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ තෙවැනි වසරේ අධ්‍යාපනය ලබනවා. අධ්‍යාපන කටයුතු කරගෙන යන ගමන් මල්ලිත් එක්ක එකතු වෙලා අලුත් සංගීත කණ්ඩායමක් හැදුවා. එහි මල්ලියි මමයි තාත්තයි ඇතුළුව සාමාජිකයෝ හත්දෙනෙක් ඉන්නවා. මගේ මල්ලිත් දෙරණ ලිට්ල් ස්ටාර් ජයග්‍රාහකයෙක්. මම බේස් ගිටාර් වාදනයත් එක්ක ගායනය. මල්ලි කීබෝඩ් වාදනයත් එක්ක ගායනය. ඒ වගේම තාත්තා සෙක්සෆෝන් වාදනයත් එක්ක ගායනය. ඉතාම ඉක්මනින් අපේ සංගීත කණ්ඩායමේ එළිදැක්වීම සිදුවේවි. මගෙ උපාධියේ වැඩ කටයුතු අවසන් වූ ගමන් වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉන්දියාවට යෑමේ බලාපොරොත්තුවත් තියෙනවා.



සිළුමිණ, රසඳුන
ලේක්හවුස්,
කොළඹ 10.
www.silumina.lk/rasanduna

සිළුමිණ රසඳුන
කලා ලොව රස කලස
රසඳුන ආරම්භය : 1996 නොවැම්බර් 03

● දුරකථන : 011 242 9267
011 242 9429
● ඊ මේල් : editor.silumina@lakehouse.lk
● ෆැක්ස් : 011 242 9260

● දැන්වීම් කළමනාකරු : 011 242 9351 / Silumina.advt@lakehouse.lk





# දැන් මම සිංගල්

▶ අනුෂා රණසිංහ

**හසිනි සැමුවෙල් කියන්නේ කලක් බොහෝ දෙනා අතර දැඩි කතාබහකට ලක් වුණු චරිතයක්. විවාහයෙන් පස්සේ නිහඬ වුණු හසිනි දැන් පුංචි පුතෙකුගේ ආදරණීය මවක්. මේ ඇයත් සමඟ කළ කතාබහක්.**

**●කොහොමද හසිනි ජීවිතේ?**

ජීවිතේ හොඳයි. මම මගේ එදිනෙදා වැඩකටයුතු එක්ක හොඳින් ජීවිතේ ගත කරනවා.

**2023 වසරේ මොන වගේ දේවල්ද කරන්න ඉන්නේ?**

මේ අවුරුද්දෙත් මගේ නිරූපණ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු සහ මගේ ව්‍යාපාරික වැඩකටයුතු සාර්ථක කර ගෙන ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා. තව මගේ ජීවිතේ අරමුණු බලාපොරොත්තු තියෙනවා ඒවාත් එකිනෙක සාර්ථක කර ගන්න එක තමයි මගෙ එකම අරමුණ.

**●ඔබ කලාවට ආ ගමනේ ආරම්භය ගැන සිහිපත් කළොත්?**

මම මුලින්ම මේ ක්ෂේත්‍රයට ආවේ 2017 දී මිස් ටුවරිසම් පැජන්ට් එක හරහා. ඒ පැජන්ට් එකේ මම second runner up වුණා. එතැනින් පස්සේ මම මිස් ඒෂියා පැසිපික් පැජන්ට් එකට ඇප්ලයි කළා. එතැනදී මම ජයග්‍රාහණය කළා. ඊට පස්සේ මම පිලිපීනයේ මැනිලාවලදී මිස් ඒෂියා පැසිපික් ඉන්ටර්නැෂනල් පැජන්ට් එකට ශ්‍රී ලංකාව නියෝජනය කළා. එතැනදී මට පුළුවන් වුණා ශ්‍රී ලංකාව වෙනුවෙන් මිනි ටයිටල් එකක් දිනා ගන්න. ඒ හරහා තමයි මම ක්ෂේත්‍රයට එන්නේ.

**●මේ වෙද්දී ගොඩක් අය රට හැර යනවා. හසිනිට එහෙම අදහසක් නැද්ද?**

අපි හැමෝම අපේ රට අතහැරලා ගියොත් මේ රට දියුණු කරන්නේ සහ අපේ රට ආදරෙන් රැක බලාගන්න ඉතුරු වෙන්නේ කවුද කියන ප්‍රශ්නය මගේ ඔළුවට එනවා. ඒ නිසා මගේ හිතේ කිසිවිටෙකත් අදහසක් නැහැ වෙන රටකට ගිහින් ජීවත් වෙන්න ඕනේ කියලා. මම මගේ රටට ගොඩක් ආදරෙයි. තමන්ට පුළුවන් නම් තමන්ගේ රටේ ඉඳලා ජීවිතේ සාර්ථක කර ගන්න, අන්න එතනයි සාර්ථකත්වය කියන එක රැඳිලා තියෙන්නේ. නමුත් මම රට රටවල්වල සංචාරය කරන්න ගොඩක් ආස කෙනෙක්.

**●කොහොමද මේ දවස්වල ව්‍යාපාරික කටයුතු?**

RADOLTE කියන මගේම බ්‍රෑන්ඩ් එක මම මේ වෙද්දී ලෝන්ච් කරලා තියෙන්නේ. එකේ වැඩ කටයුතු මම කරගෙන යනවා. බලමු ඉතින් ඉදිරියට මොකද වෙන්නේ කියලා.

**●කොහොමද පුතා එක්ක ගෙවෙන කාලය?**

ඇත්තම කියනවා නම් මම පුතා එක්ක ගෙවන කාලය තමයි ගොඩක්ම සතුටින් ගත කරන්නේ. ඒ කාලය හරිම සුන්දරයි. පුතා හරිම හුරතල් සහ එයා ගොඩක් දඟයි. මට වෙලාව යනවා දැනෙන්නෙවත් නැහැ.

**●ඔබ දැන් නිරූපණයට වැඩි ඉඩක් වෙන් කරලා ද තියෙන්නේ?**

මම දැන් දිගටම වැඩ කරගෙන යනවා. මට එන ආරාධනා අනුව ෆොටෝ ෂූට්, වීඩියෝ වැනි දේවල් වලට මගේ දායකත්වය ලබා දෙනවා. ඒ නිසාම මේ කාලයේ මම තරමක් කාර්යබහුල ජීවිතයක් ගත කරන්නේ.

**●රංගනයට එහෙම ඇරයුම් ලැබිලා තියෙනවද?**

රංගනයට ඇරයුම් ලැබුණා. නමුත් තවම මම ඒ දේවල් වලට යොමු වුණේ නැහැ. ඒ ගැන ඉදිරියේදී හිතලා බලන්න ඕනේ.

**●ගොසිප් ගැන හසිනි මොකද හිතන්නේ**

කටකතා ගොසිප් ගැන නම් මට හිනා යනවා. ඇත්තටම මට දැන් ඒවා විහිළුවක්. අපේ රටේ මිනිස්සු ඉස්සර වගේ නෙවෙයි ගොඩක් බුද්ධිමත්. ඒ නිසා මිනිස්සු දන්නවා මේ බොරු දේවල් සමාජගත කරලා තම තමන්ගේ පේජ්වල රීච් එක වැඩි කර ගන්න හදන්නේ කියන එක. ඒ නිසාම කට කතා ගොසිප් විශ්වාස කරන ප්‍රතිශතය දැන් ගොඩක් අඩුයි. ඒ නිසා මම කටකතා ගොසිප් ගැන බලන්නේ නැති තරම්. කටකතා ගොසිප් කියන දේ මට නම් දැන් ඇත්තටම ජෝක් එකක්.

**●තනිවීම ගැන දුකක් නැද්ද?**

දුකක් නැත්තේ නැහැ. දුකක් තියෙනවා. නමුත් ජීවිතේ හැමදේම වෙන්නේ හොඳට කියලා හිත හදාගෙන ඉන්නවා.

**●ආයෙමත් ආදරයක් හිතට දැනිලා නැද්ද?**

මෙහෙමයි ආදරේ කියන දේ හිතට දැනෙන්නේ නැත්තේ නැහැ. ආදරේ කියන්නේ හැඟීමක්. කතාවටත් කියනවනේ ලෝකයේ තියෙන සුන්දරම දේ තමයි ආදරේ කියන්නේ කියලා. පෞද්ගලිකව මට දැන් ආදරේ කියන දේ දැනෙන්නේ සහ ලැබෙන්නේ මගේ මවුපියන්ගෙන්, දරුවාගෙන් සහ මට හිතවත් යාළුවන්ගෙන්. එතැනින් එහාට ආදරේ කියන දේ මම අත්වින්දේ මීට අවුරුදු ගාණකට කලින්. දැන් මම කාලයක් තිස්සේ සිංගල්. ඉදිරියේදී ආදරයක් දැනෙයි ද කියන්න මම දන්නේ නැහැ. ඒක දෙවියන් වහන්සේ තමයි තීරණය කරන්නේ.

**●හැමදාම පුතා එක්ක ඔහොම ඉන්නද කල්පනාව?**

ඔව්. මට ඕනේ මගේ පුතාට හොඳම හොඳ අම්මා කෙනෙක් වෙන්න.

**●අනාගත බලාපොරොත්තු මොනවද?**

මගේ ජීවිතේ සාර්ථක කරගෙන මගේ අරමුණු ඉලක්ක වෙත යන එක තමයි මගේ එකම බලාපොරොත්තුව. මම විශ්වාස කරනවා ඒ දේවල් කරගන්න මට දෙවියන් වහන්සේ ශක්තිය ධෛර්යය ලබා දෙයි කියලා. ඒ වගේම කලා ක්ෂේත්‍රය පැත්තෙනුත් දිගු ගමනක් යන්න මම බලාපොරොත්තු වෙනවා.

**ගොසිප් කියන දේ මට නම් දැන් ඇත්තටම ජෝර්ක් එකක්**

**තමන්ගේ රටේ ඉඳලා ජීවිතේ සාර්ථක කර ගන්න පුළුවන් නම් අන්න එතැනයි සාර්ථකත්වය රැඳිලා තියෙන්නේ**

**ඉදිරියේදී ආදරයක් දැනෙයි ද කියන්න මම දන්නේ නැහැ**





# ඇයි මම ලංකාවේ ඉපදුණේ කියලා

## මට සිය දහස් වර හිතුණා නමුත් දැන් මට එහෙම හිතෙන්නේ නැහැ



▶ විශ්මි ප්‍රනාන්දු

**එශාන් ඩයස් කිව්වම මුහුණ පුරා ඇදෙන හිනාව, කොණ්ඩෙ පස්සට විසි කර ගස්සන ගැස්සිල්ල, ලාලිත්‍යයට නළවන උකුල චිත්‍රපටි රාමු පෙළක් සේ එක පෙළට මතකයට නැඟෙන්නේ ඔහු ඒ තරමටම සහෘද සිත් කාන්දමක් සේ ඇද බැඳ ගත් නිසයි. එසේ සමාජ මාධ්‍ය තුළ අපූරු චරිතයක් වූ ඔහු ගැනයි මේ සටහන.**

**●කොහොමද මේ දවස්වල ජීවිතේ..**

මේ දවස්වල සාමාන්‍ය විදිහට වැඩ ටික, කරගෙන යනවා. ඒත් මම තරමක් කාර්යබහුලයි. අලුත් සංකල්පයකට ෆොටෝ ෂූට් එකක් කිරීමට ලෑස්ති වෙනවා. ඒ වගේම වීඩියෝ, ටික්ටොක්, ෆේස්බුක් හි සාමාන්‍ය වැඩකටයුතු කරගෙන යනවා. ඊට අමතරව මියුසික් වීඩියෝ කිහිපයකට ආරාධනා ලැබී තිබෙනවා. ඒවත් ඉදිරියේදී දක්නට ලැබේවි.

**●ෆේස්බුක්, යූ ටියුබ් හී වීඩියෝ පළ කරන්න මුලින්ම සිතිවිල්ල පහළ වුණේ කොහොමද?**

මම කිසිම දැනුවත් කමකින් ෆේස්බුක් එකේ වීඩියෝ පළ කළේ නැහැ. මට ලොකු ආසාවක් තිබුණා චිත්‍රපටයකට රංගනයෙන් දායක වෙන්න. ඒ නිසා මම ජාතික චිත්‍රපටි සංස්ථාවේ චිත්‍රපට අධ්‍යක්ෂණය පිළිබඳව පාඨමාලාවක් කළා. එයින් පසුව ෆේස්බුක් එකට වීඩියෝ එකක් කරන්න මට හිතුණා. මම වීඩියෝ පළකරන්න ආරම්භ කළේ 2016 වර්ෂයේ දීයි. 2016 වර්ෂයේ ජුනි මාසය වනකොට මගේ වීඩියෝ එකක් වයිරල් වුණා. මට අවශ්‍ය වුණේ මගේ හැකියාව ප්‍රදර්ශනය කරන්න පමණයි. ෆේස්බුක් හරහා දිගු ගමනක් යෑමේ බලාපොරොත්තුවක් ඒකාලේ මට තිබුණේ නැහැ.

**එවැනි මිනිසුන්ගේ දුර්වලතා මං මගේ කරගෙන දුක් වෙන්නේ නැහැ**

**●ඔබ ලංකාවේ හෝ ජාත්‍යන්තරයේ ෆලෝ කරන කෙනෙක් හෝ කණ්ඩායමක් සිටිනවා ද?**

ඔව් මම යූ ටියුබ් එකට ආගන්තුක අවධියේදී ගප්පියාව ෆලෝ කළා. ලිලීසින්, ලීසාකෝශි වැනි විදේශික යූ ටියුබර්ස්ලවත් මම ෆලෝ කළා.

**●කාන්තාවක් විදිහට අඳින පලඳින drag performer කෙනෙකු වීමේ සංකල්පය ඔබට ආවේ කොහොමද?**

මගේ වීඩියෝස්වල වැඩිපුරම වීව්ස් තියෙන්නේ මම අම්මගේ චරිතය හෝ ලතාගේ චරිතය කරන අවස්ථාවලදීයි. ඒ නිසා එය මං ගත් ස්වාධීන තීරණයක් නෙමෙයි. වැඩි ප්‍රේක්ෂක ප්‍රතිචාර නිසා මම එයට යොමු වුණා. එය කලාවක්. ඒ වගේම එයටත් නමක් තියෙනවා කියලා මම දැනගත්තේ පසුවයි.

**●හැම වීඩියෝ එකකම සංකල්පය දෙබස් නිර්මාණය කරන්නේ ඔබමද?**

අපි එදිනෙදා ඇහෙන දකින සිද්ධි පාදක කරගෙන හිතට දැනෙන අදහස් මං එවෙලෙම නෝට් කරගන්නවා. නැත්නම් වොයිස් මැසේජ් එකක් දාගන්නවා. එහෙම නැතුව ස්ක්‍රිප්ට් එකක් ලියන්න කියලා හිතුවොත් කවදාවත් ලියන්න අදහස් හිතට එන්නේ නැහැ. මම කරපු ගොඩක් වීඩියෝස් මගේ පිටපත්වලට කළ නිර්මාණයි. වීඩියෝ තුනකට පමණ පාඨකයන්ගේ අදහස් හා මගේ දන්න අයියා කෙනෙක් ලියන දුන්නා. ඒවත් මට අවශ්‍ය ලෙස මම වෙනස් කර ගත්තා.

**●යූ ටියුබ් චැනල් බහුතරයක් ප්‍රහසනය පාදක කරගෙන නිර්මාණය කරන නිසා ඉෂාන්ට එය අභියෝගයක් වුණේ නැද්ද?**

තරගයක් නැතිවම නෙමෙයි. නමුත් එෂාන් ඩයස් කරන දේ වෙන කාටවත් කරන්න බැහැ. පිරිමි කෙනෙක් ගැහැනු කෙනෙක් විදියට ඇඳගෙන නිර්මාණ කළත් මගේ නිර්මාණවල තියන සංකල්ප කාටවත් ගන්න බැහැ. ඒ නිසා එය තරගයක් ලෙස මම හිතන්නේ නැහැ.

**මගේ ප්‍රේක්ෂකාගාරය සමාජයීය දැනුමෙන් ගොඩක් පොහොසත්. ඒ නිසා ඔවුන් ග්‍රහණය කරගන්න මට පහසුයි**

**●බාල විහිළුවලට හිනා වෙන බහුතර ප්‍රේක්ෂකාගාරයක් උසස් ප්‍රහසනයකට ලඝු කරන්න අපහසුයි කියලා ඔබට හිතෙන්නේ නැද්ද**

ඒක ලොකු ප්‍රශ්නයක් .පොඩි ළමයෙක්ව හිනස්සන්න ශබ්දයක් පිට කළත් ඇති. නමුත් දැනුමෙන් වැඩි පුද්ගලයෙක්ව හිනැස්සීම බොහෝම අසීරු කර්තව්‍යයක්. එහෙම බුද්ධි මට්ටම වැඩි කෙනෙක්ව හිනස්සන්නනම් මහන්සි වෙලා ඒ ජෝක් එක කරන්න ඕනි. ලංකාවේ බහුතරයකට නොසරුප් වචනයක් කියලත් එයාලව අවුස්සන්න පුළුවන්. බාල මට්ටමේ ප්‍රේක්ෂකාගාරයක් වුවත් තිබිය යුතුයි. නමුත් මගේ ප්‍රේක්ෂකාගාරය සමාජීය දැනුමෙන් ගොඩක් පොහොසත්. ඒ නිසා ඔවුන් ග්‍රහණය කරගන්න මට පහසුයි. සමස්ත ප්‍රේක්ෂකාගාරය සතුටුදායක මට්ටමක නැහැ. නමුත් මගේ නිර්මාණය එම සමස්තයට කොටු කරන්නේ නැහැ.

**●චිත්‍රපටිවල රඟපාන්න කැමැති නිසා වීඩියෝ කරන්න පෙලඹුණා වගේම වීඩියෝ නිසා චිත්‍රපටිවල රඟපාන්න ආරාධනා ලැබුණේ නැද්ද?**

මේ වන තෙක් චිත්‍රපටි වලට ආරාධනා ලැබී නැහැ. ටෙලි නාට්‍යවලට ආරාධනා ලැබුණා වගේම නාට්‍යයකට රංගනයෙන් දායක වුණා. තවත් ආරාධනා කිහිපයක් ලැබී තිබෙනවා. තවම ඒවාහි දින වකවානු සාකච්ඡා මට්ටමෙහි පවතිනවා.

**●අද පවතින ජනප්‍රියත්වය හෙට නැති නිසා ආර්ථිකය යහපත් මට්ටමින් පවත්වාගෙන යන්න දෙවෙනි සැලසුමක් ඔබට තිබෙනවාද?**

සමාජ මාධ්‍ය තුළ ලැබෙන ආදායම අස්ථාවරයි. ඒ නිසා ස්ථිර රැකියාවක් ලෙස එය කිරීමට අපහසුයි .මම මේ වන විට පෞද්ගලික අමතර පන්ති පවත්වනවා. එවැනි කාලයක් උදා වුණොත් මම එය දියුණු කරාවි.

**●මිනිස්සු නිර්මාණයක් රස විඳිනවාට වඩා නිර්මාණ ශිල්පියාගේ පෞද්ගලික ජීවිතයට එබිකම් කරනවා වැඩියි. ඔබට එය බාධාවක් වුණේ නැද්ද?**

ඔව් එය මට දරුණු වේදනාවක් ලෙස දැනුණා. 2016 වර්ෂයේ දී යූ ටියුබ් එකේ වීඩියෝ කරන්න පටන් ගත්තත් මට පසුව පැමිණි යූ ටියුබ්ස් ලා ස්ථාවර තත්ත්වයට පත් වුණා. මම ඒ වන විටත් ස්ථාවරයක් ගොඩනඟා ගන්න අරගල කරනවා. මම අනුග්‍රාහකයන් ළඟට ගියාම ඔවුන් මට අනුග්‍රහය දක්වන්න මැලි වුණා. සාමාන්‍ය පිරිමි ළමයෙක්, ගැහැනු ළමයෙක් වීඩියෝ එකක් කරාම ඒක බලලා හිනා වෙලා එතනින් ඉවර කරනවා. ඒත් මගේ පෞද්ගලිකත්වය හොයල, ඒකට කටකතා පතුරවලා වෙනම සංකල්පයක් මිනිස්සු ගොඩනඟනවා. ඒ නිසා ඒ බාධක කඩාගෙන මට ඉස්සරහට යන්න සිදුවුණා. මුලින්ම මගේ වීඩියෝ බැලුවත් ඒවා ශෙයා කළේ නැහැ. මගේ වීඩියෝ එකක් එයාලගේ වෝල් එකට ශෙයා කරගන්න එක ලැජ්ජාවක් කියලා එයාලා හිතුවා. ඒ නිසා එය මට දරුණු මානසික පීඩනයක් වුණා. ඇයි මම ලංකාවේ ඉපදුණේ කියලා මට සිය දහස්වර හිතුණා.

**●ඔබ මේ වන විටත් සිටින්නේ ඒ වගේම කලකිරුණු හැඟීමකද?**

ඇත්තටම දැන් මට එහෙම හැඟීමක් දැනෙන්නෙ නැහැ. මගේ මනස පුහුණු වෙලා තියෙන්නෙ ධනාත්මක දේවල් ග්‍රහණය කරගන්න පමණයි. ඉස්සර මං මිනිස්සුන්ගේ කමෙන්ට් බලලා පෞද්ගලිකව හිතලා දුක් වුණා. යම් පුද්ගලයෙක් කමෙන්ට් කරන ආකාරය මත ඔහුගේ හෝ ඇයගේ මානසික තත්ත්වය පැහැදිලි වෙනවා. ඒ නිසා එවැනි මිනිසුන්ගේ දුර්වලතා මං මගේ කරගෙන දුක් වෙන්නේ නැහැ. ඒක ඔවුන්ගේ ගැටලුවක් විනා මගේ ප්‍රශ්නයක් නෙමෙයි. මේ වන විට මගේ ප්‍රේක්ෂකාගාර බහුතරයකට මං ගැන තියෙන්නෙ ධනාත්මක ආකල්පයක්. ඒනිසා ඍණාත්මක හැඟීමක් මටත් දැනෙන්නේ නැහැ.

**●ඔබගේ අනාගත බලාපොරොත්තු මොනවාද?**

මගේ ලොකුම බලාපොරොත්තුව චිත්‍රපටියක් කිරීම වගේම එහි රඟපෑමයි.

**●විවාහයක් කරගන්න මේ හොඳම කාලේ කියලා හිතෙන්නේ නැද්ද?**

මම විවාහයට ප්‍රතිවිරුද්ධ අදහස් දරන කෙනෙක් නෙමෙයි . නමුත් එය කරන්නන්වාලේ කරන්න මගේ අදහසක් නැහැ. විවාහය කියන්නේ හැමෝටම අයිති විය යුතු දෙයක් කියලා මම විශ්වාස කරනවා. ආදරය කරන දෙන්නෙක් එකිනෙකාව තේරුම් ගත්තම අදාළ කාලයේදී එය සිදුවේවි. එය මටත් වලංගුයි




ENEXUS



## “එයා දැන් බැඳලා”

**විවෘත කතිකාව 13 වැනිදා සවස 3.00 මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.**



**‘එයා දැන් බැඳලා‘ විවෘත කතිකාවතක් පෙබරවාරි 13 වැනි සඳුදා සවස 3ට මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. මෙම කතිකාවතට අදහස් දැක්වීම සඳහා විදර්ශන කන්නන්ගර, තනූජා ජයවර්ධන, සඳුන් ප්‍රියන්කර විතානගේ සහ මනෝරම වීරසිංහ ආදි ප්‍රවීණයෝ සහභාගි වෙති. “එයා දැන් බැඳලා“ සාර්ථකත්වයට හේතූන් එහිදී කතිකාවතට ලක්වනවා ඇත.**

සෙවණැලි සහ මිනිස්සු වේදිකා නාට්‍යයෙන් කලාවට පිවිසි ප්‍රසන්න ජයකොඩි ජාත්‍යන්තර ඒ ශ්‍රේණියේ සිනමා සම්මාන උලෙළවල සම්මානිත අයෙකි.

ඉමදිය මංකඩ, සඳ අමාවකයි, හදවිල සක්මන, නිසල විල ආදී මෙරට ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ නම රැන්දූ බොහොමයක් ටෙලි නාට්‍යවල අධ්‍යක්ෂවරයා ද ඔහුය.

දශක දෙකක පමණ දිගු නිහැඬියාවකින් පසුව නැවතත් ඔහු කතාබහට ලක්වන තාලේ වෙනස්ම ටෙලි නාට්‍යයක් ප්‍රේක්ෂකයාට තිළිණ කළේය. ඒ ‘එයා දැන් බැඳලා‘ ටෙලි සිත්තමයි. පසුගිය නොවැම්බර් 26 වැනිදා සිට සෑම සෙනසුරාදා සහ ඉරිදා දිනකම රාත්‍රී 8.30ට ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය ඇරැඹියේය. වසන්ත කන්නන්ගරගේ නිෂ්පාදනයක් වන මෙහි මහේන්ද්‍ර පෙරේරා, සේමිණී ඉද්දමල්ගොඩ, සරත් කොතලාවල, ප්‍රදීප් රාමවික්‍රම, ඇතුළු ප්‍රවීණ දක්ෂ සම්මානලාභී නළු නිළියන් රැසක් රංගනයෙන් දායක වෙති.







# ජීවිතයේ ඇතින් තබා ගත යුතු පුද්ගලයන් හඳුනා ගනිමු

**අපි ජීවිතේදී බොහෝ පුද්ගලයින් ආශ්‍රය කරනවා. ඉතින් මේ පුද්ගලයන් විවිධාකාර වෙනවා. ඔවුන්ට අපේ අදහස් ගැළපෙනවා වගේම සමහර අවස්ථාවලදී අදහස් නොගැළපීම් ද ඇති වෙන්න පුළුවන්. මිනිසුන්ගේ අදහස් විවිධ වන නිසාත් ගති පැවතුම් එකිනෙකට වෙනස් වන නිසාත් අප ආශ්‍රය කරන පුද්ගලයින් අපට නොගැළපෙනවා යැයි හැඟෙන්න පුළුවන්. ඉතින් මේ වගේ අපේ ජීවිතේ අනිවාර්යයෙන්ම ඈත් කළ යුතු පුද්ගලයින් හත් දෙනෙක් ගැන තමයි මේ ලිපියෙන් කියවෙන්නේ. ජීවිතය සාර්ථක මනුස්සයෙක් වෙන්න නම් ජීවිතේ දිනන්න නම් අපි හැමෝටම අනිවාර්යයෙන්ම උදව්වක් අවශ්‍ය වෙනවා. ඉතිං මේ උදව්වට උපකාරයට බාධා කරන කිසිම කෙළෙහි ගුණයක් නොදක්වන අපේ දියුණුවට බාධා කරන පුද්ගලයෙක් නම් ඔහුව අපි ජීවිතයෙන් ඈත් කළ යුතුමයි. මෙවැනි පුද්ගලයන් අපට හඳුනාගන්න තරමක් අපහසු වන නමුත් දිගු කාලයක් ආශ්‍රය කිරීමේදී අපට මේ වගේ පුද්ගලයින් හඳුනා ගැනීමේ හැකියාවක් ලැබෙනවා. ඉතින් මේ පුද්ගලයින් හත්දෙනා කවුද කියලා අපි දැන් බලමු.**

## 1. උඩින් මිතුරුකමක් පෙන්වමින් සතුරකු ලෙස ක්‍රියා කරන පුද්ගලයෙක්

අපිට අපේ ජීවිතයේදී විවිධාකාර වූ පුද්ගලයන් මුණගැහෙනවා. ඔවුන් අපට සමහරවිට එක දවසක් හමුවී ඊළඟ දවසේ මුණ නොගැසුණු සමහර පුද්ගලයින් අපේ ජීවිත වලට ඇවිත් නවතිනවා. ඉතින් මේ වගේ අපේ ජීවිතවලට මිතුරුකම් පාමින් එන හැම පුද්ගලයෙක්ම සැබැවින්ම මිතුරු කමින් ඉන්නවද කියන එක පොඩි ප්‍රශ්නයක්. ඉතින් ගොඩක් වෙලාවට ඔයා දක්ෂ කෙනෙක් නම් ඔයා දියුණු වෙන්න හදන කෙනෙක් නම් ඔයත් එක්ක ගොඩක් මිතුරෝ ළං වෙනවා. මේ අතරින් සමහර මිත්‍රයන් ඇත්තටම මිතුරු කමක් දක්වන නමුත් සමහර මිතුරන් ඉන්නවා මිතුරන් වගේ සිටියට ඇත්තටම කරන්නේ සතුරුකම්. ඔබ වැඩිපුරම පරිස්සම් වෙන්න ඕනේ මෙන්න මේ වගේ පුද්ගලයින්ගෙන්. ඔවුන් ඔබට මිතුරෙකු වගේ ඉන්න නිසා ඔබ සමහරවිට රැවටීම්වලට හසුවෙන්න පුළුවන්. ඔවුන් සැබවින්ම කරන්නේ ඔබගේ දියුණුවට බාධා කරන එක. ඔබව අධෛර්යමත් කරන එක. එවැනි මිතුරන් ඈත් කර ගැනීමත් ඔබ කළ යුතුම දෙයක් වනවා. ඉතින් ඔබ කළ යුත්තේ උඩින් මිතුරුකම් යටින් සතුරුකම් කරන පුද්ගලයන් ඔබේ ජීවිතයෙන් ඈත් කර සාර්ථකත්වය කරා ඔබට අතහිත දෙන පුද්ගලයින් පමණක් ආශ්‍රය කිරීමයි.

## 2. ඕපාදූප කාරයෝ

අපිට හම්බෙන පුද්ගලයන්ගෙන් සමහරු ඇත්තටම කරන්නේ අපේ ඕපාදූප ටික හැමතැනම කියන එක. තමන් ගාව ළඟින් සිටිමින් බොරුවට සුහද කමක් පාමින් තමන් නැති වෙලාවට තමන්ට බණින, තමන්ගේ වැරදි කියන තමන්ගේ අඩුපාඩු කම් කියන, තමන් කාටවත් නොකියන්න යැයි කියූ රහස් කියන පුද්ගලයින්ට තමයි මේ ඔහු පොදු උපකාර ගැන කියන්නේ. ඉතින් මේ වගේ පුද්ගලයින් ගොඩක් අපි අතර ඉන්නවා. මොවුන් හැම වෙලාවෙම කරන්නේ ඔබේ දියුණුවට බාධා කරන එක. ඔවුන් නිසැකවම අපිට ඉරිසියා කරන්න පෙලඹෙනවා. ඔවුන් හැම වෙලාවෙම හිතන්නේ අපේ වැරැද්දක් කියලා සතුටක් ලබන්න. ඉතින් ඔබත් මෙවැනි ඕපදූපකාරයන්ගෙන් ඈත් වෙන්න වගබලා ගන්න ඕන.

## 3. හැඟීම් අවතක්සේරු කරන පුද්ගලයන්

අපට ජීවිතයේ විවිධ පුද්ගලයින් හමු වෙනවා. ඉතින් මේ අතරින් අපේ හැඟීම් තේරුම් ගත්ත පුද්ගලයෙක් අපිට හම්බෙන්නෙ කලාතුරකින්. අපි ගොඩක් වෙලාවට සතුටෙන් ඉන්නකොට අප වටා ගොඩක් පුද්ගලයින් එකතුවෙලා හිටියා. අපිට දුකක් කරදරයක් වුණාහම අප ළඟ ඉන්නේ ඉතාමත්ම සුළු පිරිසක් විතරයි. අපට දුකකදී පිහිටවන්න පුළුවන් අපගේ හැඟීම් තේරුම් ගන්න පුද්ගලයින්ට පමණයි. නමුත් මෙවැනි පුද්ගලයන් සොයා ගන්න ඉතාමත්ම අමාරුයි. ඔබ ළඟ සිටිනවා නම් ඔබගේ හැඟීම් තේරුම් ගන්න පුළුවන් පුද්ගලයෙක් ඔහුව ආශ්‍රය කළ යුතුමයි. නමුත් ඔබගේ හැඟීම්වලට විහිළු තහළු කරන ඔබත් සමඟ කරදරයකදී නොසිටින පුද්ගලයින් ඔබ ජීවිතයෙන් ඈත් කරගත යුතුයි.

## 4. එකම වරද නැවත නැවත කරන පුද්ගලයන්

පුද්ගලයෙක් අතින් වැරැද්දක් වෙන එක සාමාන්‍ය දෙයක්. නමුත් ඔහු එම වැරැද්ද නැවත නැවත කරනවා නම් එයට සමාව දීම අපි නැවත නැවතත් කරනවා නම් එය ඇතැම්විට මෝඩකමක් වෙන්න පුළුවන්. ඔබේ ඉතාමත්ම සමීප හිතවතෙකුට යම් කිසි වැරැද්දක් කළ විට එය පෙන්වා දීමට උත්සාහ කිරීමේදී ඔහු එයට පිටුපානවා නම් ඔබ එම පුද්ගලයා අත හැරිය යුතුයි. ඔවුන් ඔබට සාර්ථකත්වය ළඟාකර දීමට කිසිසේත්ම කටයුතු කරන්නේ නැහැ. ඔබ සිටිනවාටත් වඩා පහත් තත්ත්වයට ඇද දැමීමට ඔවුන් කටයුතු කරනවා. ඉතිං මෙලෙස එකම වරද නැවත නැවත කරන පුද්ගලයෙකුට ඔබ සමාවදී එම වරද හදාගෙන ඔබේ ළඟින් තියා ගැනීමට හැකි වුවත් එසේ නොකරනවා නම් ඔබ එම පුද්ගලයාගෙන් ඉවත් වීම හෝ ඔබ ඔහුගෙන් ඉවත් වීම කළ යුතුයි.

## 5. පෞරුෂය මවා දක්වන පුද්ගලයන්

පෞරුෂය මවා දක්වන පුද්ගලයන් කියලා කියන්නේ තමන්ගේ ඉදිරියේ එක් ආකාරයකටත් තවත් කෙනෙකු ඉදිරියේ තවත් ආකාරයකටත් හැසිරෙන පුද්ගලයන්ට. ඔවුන් හැම විටම කරන්නේ රඟපෑමක් පමණි. ඔවුන්ට ඇති පෞරුෂයක් නැත. ඔවුන් කරන්නේ ඔබ ඉදිරියේදී හොඳ පුද්ගලයෙකු වීමට හොඳ විදියට හැසිරෙනවා. තවත් කෙනෙකු ඉදිරියේ ඔබගේ ආත්මගරුත්වය නැතිවෙන ආකාරයට හැසිරෙනවා. මෙලෙස මවාපාමින් පෞරුෂය ගොඩනගා ගන්නා සූදානම් වන පුද්ගලයින් ඔබගේ ඇසුරෙන් ඉවත් කළ යුතුයි. නැතිනම් ඔබගේ සාර්ථකත්වයට මෙන්ම ඔබගේ ජීවිතයට ද මොවුන් බලපෑම් කිරීමට සැරසෙන්නේ ඔබ නොසිතන ආකාරයකින්.

## 6. සර්ව අසුබවාදී පුද්ගලයන්

ඒ කියන්නේ හැමදේම අසුභ බව දකින පුද්ගලයින්ට. ඔවුන් හැම වෙලාවේම හැමදේම අයහපත් විදිහට දකී. එයින් ඔබේ මානසික මට්ටම ද පහත හෙළන්න හැකියාවක් තියෙනවා. ඒ කියන්නේ ඔබ යම්කිසි අධිෂ්ඨානයකින් ඉන්නවා නම් එම අධිෂ්ඨානය නැති කර දැමීමට මේ සර්ව අශුභවාදී පුද්ගලයන්ට හැකියාවක් තියෙනවා. උදාහරණයක් ලෙස ඔබ යම් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැරසීමේදී ඔබ එය ඔබ අසල සිටින පුද්ගලයකුට පවසනවා නම් එම පුද්ගලයා ඔබට එම ව්‍යාපාරය පිළිබඳ පවසන්නේ ධනාත්මක සිතුවිලි නොව අසුබවාදී සිතුවිලි නම් එවැනි පුද්ගලයින් ඔබ ඇසුරෙන් ඉවත් කළ යුතුයි. එයින් ඔබට මෙන්ම ඔබගේ චිත්තවේග වලට ද ඇතිවන්නේ අසුභදායි බලපෑමක්.

## 7. අනෙක් අය සමඟ වාසිය තකා කටයුතු කරන පුද්ගලයන්

අප සමාජයේ බොහෝ පුද්ගලයින් සිටින්නේ අන් එකෙකුගෙන් වාසියක් බලාපොරොත්තුවෙන් කටයුතු කරන පුද්ගලයින් ය. ඉතින් මෙවැනි පුද්ගලයෙක් ඔබ ළඟට ළන්වෙන්නෙත් ඔබගෙන් වාසියක් පමණක් බලාපොරොත්තුවෙන්ය. මෙවැනි පුද්ගලයින් හඳුනා ගැනීමට වඩා වැදගත් වෙන්නේ එය ඔබේ සාර්ථකත්වයට ඔබගේ මුදල් පසුම්බියට ද හිතකර වන බැවිනි. ඇතැම්විට ඔබගේ මිතුරෙක් ලෙස ඔබට ළං වන පුද්ගලයා ඔබ සමඟ මිතුරෙකු ලෙස රඟපාමින් ඔබගෙන් වාසි ලබා ගැනීමට සැරසෙන බවක් දැනේ නම් ඔබ එම පුද්ගලයාගෙන් ක්‍රමානුකූලව ඉවත් වීම කළ යුතුයි.





නැන්දා තමයි අප්පච්චිට කිව්වේ මෙයාට අවස්ථාවක් දෙමු කියලා

# අවුරුදු කුමරිය ලෙස තේරුණු නිසයි මගේ හීනයට යන පාර හැදුණේ

► අනුෂා රණසිංහ

**මේ දිනවල ඔබ ආසාවෙන් බලන නාට්‍යය නිර්මාණ දෙකක් තමයි කෝලම්කුට්ටම සහ කියාදෙන්න ආදරේ තරම් කියන්නේ. අද මේ කතා බහ කෝලම්කුට්ටමේ සංගීතා සහ කියාදෙන්න ආදරේ තරම් හි චමදරී සමඟ. මේ චරිත හරහා ඔබේ ආලින්දයට එන්නේ අලුත් මුහුණක්. ඇය නමින් සචින්ත්‍යා අරුන්දතී. මහනුවර ස්වර්ණමාලි බාලිකා විද්‍යාලයෙන් ඉගෙනුම ලැබ මුලින්ම කලාවට සම්බන්ධ වන්නේ 2022 සිරස වසන්ත කුමරිය ලෙස අබිසෙස් ලැබීමත් සමඟය.**

**● ඔබ කලාවට සම්බන්ධ වෙන්නේ කොහොමද?**

මම 2022 සිරස වසන්ත කුමරිය ලෙස අබිසෙස් ලැබුවා. ඒ ඔස්සේ තමයි මට රංගනයට පිවිසෙන්න අවස්ථාව ලැබුණේ. සද්ධා මංගල සූරියබණ්ඩාර සර්ව මතක් කරන්න ඕනේ. සර් මා ගැන විශ්වාසය තියලා සර්ගේ නිර්මාණයට මාව සම්බන්ධ කර ගත්තා. ඒක මට ලොකු ගෞරවයක්. ඒ වගේම ආදරෙන් සහ ගෞරවයෙන් ධනුෂ්ක රත්නායක අයියාව මතක් කරන්න ඕනේ. ධනුෂ්ක අයියාගේ කියාදෙන්න ආදරේ තරම් නාට්‍යයට සම්බන්ධ වෙන්න මට අවස්ථාව ලබා දුන්නා. ධනුෂ්ක රත්නායක අයියා කියන්නේ ගොඩක් නවකයින්ට අවස්ථාව ලබා දෙන කෙනෙක්. ඒ එක්කම සිරස ආයතනයට ස්තුතිවන්ත වෙන්න ඕනේ. ඔවුන්ගේ සිරස වසන්ත කුමරිය ලෙස තේරීම නිසා තමයි මගේ හීනයට යන පාර හැදුණේ. මගෙ මුල්ම නාට්‍ය කෝලම්කුට්ටම ටෙලි නිර්මාණයයි.

**●කොහොමද ඒ අත්දැකීම?**

එය මට ගොඩක් ලොකු අත්දැකීමක් කිවුවොත් නිවැරැදියි. මගේ ජීවිතේ ප්‍රථම රංගනය. රූපවාහිනියෙන් නාට්‍යය බලලා තිබුණට නාට්‍යයක් කොහොමද හැදෙන්නෙ කියලා දැකලා තිබුණේ නැහැ. ඉතින් ඒකම මට ලැබුණු ලොකු අත්දැකීමක් වුණා. ඒ එක්කම කෝලම්කුට්ටම නාට්‍යයේ ගොඩක් අපිට තිබ්බෙ ගඟ මැද ඉස්සන් කොටු ළඟ ෂූටින්. ජීවිතේ පළමු වතාවට ඉස්සෝ කොටුවක් දැක්කෙත් එදා තමයි. කාවින්ද්‍යා දුල්ශානි අක්කා එක්ක තමා මට වැඩිපුරම ෂූටින් තිබ්බෙ. අපි ඔරු පැද්දා. මම හරිම ආසාවෙන් වින්ද අත්දැකීම් ගොඩක් තියෙනවා කෝලම්කුට්ටම නාට්‍යය හරහා.

**●ඔබ කවදා හරි නිළියක් වෙන්නම ද ආසා කළේ?**

ඒක එහෙම කිවුවොත් තමයි හරි. මම පොඩි කාලෙ ඉඳන්ම කැමැත්තෙන් හිටියේ නිළියක් වෙන්න. මම අම්මට අප්පච්චිට නිතරම කියලා තියෙනවා මට නිළියක් වෙන්න ඕනේ කියලා. එයාලා මට කිවුවෙ මුලින්ම හොඳට ඉගෙන ගන්න. හොඳින් ඉගෙන ගත්තොත් නිළියක් වෙන්න අවස්ථාවක් දෙන්නම් කියලා. ඒ අවස්ථාව අද වෙද්දි ලැබිලා තියෙනවා. ඒ ගැන හරිම සතුටුයි. මගෙ අම්මා ගුරුවරියක්. අප්පච්චි රාජ්‍ය නොවන සංවිධානයක විධායක අධ්‍යක්ෂවරයෙක්. මගෙ මල්ලි දැනට ශ්‍රී ජෝන් කොතලාවල විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පළමු වසරේ ඉගෙන ගන්නවා. මේ හැමෝගෙම සහාය මට ලැබෙනවා.

**●රංගනය ගැන හැදෑරීමක් කරනවද?**

මම පාසලේදී පාසල් වේදිකා නාට්‍යය කළා. ඊට පස්සෙ මම ධනුශ්ක රත්නායක අයියා මෙහෙයවන වීණාවි ඇක්ටින් ස්කූල් එකට සම්බන්ධ වුණා. ඒ නිසා මම මේ වෙලාවේ ධනුශ්ක රත්නායක අයියාට සහ ප්‍රියන්ත ලාල් සර්ට ස්තූතිවන්ත වෙනවා.



පොඩි කාලේ ඉඳන්ම කැමැත්තෙන් හිටියේ නිළියක් වෙන්න



**●මේ දවස්වල කෝලම්කුට්ටමේ චරිතය සහ කියාදෙන්න ආදරේ තරම් හි චරිත ගැන පොඩ්ඩක් කියමුද?**

කෝලම්කුට්ටමේ සංගීතා කියන්නේ ගම්බද චරිතයක්. කෝලම් මුහුණු හදන ගෙදරක දුවක්. හරිම කෙළිලොල් ගම්බද චරිතයක්. කියාදෙන්න ආදරේ තරම් හි චමදරී කියන්නේ නුවර හැදිලා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ඉගෙන ගෙන නැවත නුවර ඇවිත් ඉන්න චරිතයක්. ඒ චරිතයත් ටිකක් කෙළිලොල් චරිතයක්. හැබැයි එකිනෙකට වෙනස් වූ චරිත දෙකක්.

**●ඒ චරිත දෙකට මේ වෙද්දි ලැබෙන ප්‍රතිචාර මොනවාද?**

කෝලම්කුට්ටමේ සංගීතාට ගොඩක් හොඳ ප්‍රතිචාර ලැබෙනවා. මම යූ - ටියුබ් එකට දාලා තියෙන කමෙන්ට්ස් කියවනවා. කියාදෙන්න ආදරේ තරම් හි චමදරී කියන චරිතය මෑතකදී නාට්‍යයට එකතු වුණේ. දැනටමත් හොඳ ප්‍රතිචාර ලැබෙනවා. තවම මම මේ කලාවට ආවා විතරයි. ඉතින් ප්‍රේක්ෂක ප්‍රතිචාර දකිද්දී මට ලොකු සතුටක් දැනෙනවා. ඉදිරියටත් ප්‍රතිචාර ලැබෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

**●මොන වගේ චරිත ද කරන්න කැමැති?**

මට දැනට ලැබිලා තියෙන්නේ ටිකක් දඟකාර කෙළිලොල් චරිත. ඒ නිසා මම ආසයි ටිකක් අහිංසක තැන්පත් චරිතයක් කරන්න. ඒ වගේම විලන් චරිතයක් කරන්නත් ආසයි. මොකද හැම චරිතයක් තුළින්ම අත්දැකීම් ලබන්න පුළුවන් නිසා විවිධ චරිත කරන්නයි කැමැත්ත.

**●දිගටම රඟපාන්න ද ආසාව?**

මම දැනට ශ්‍රී ලංකා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ දෙවන වසරේ ඉගෙන ගන්නවා. ඒ නිසා අධ්‍යාපන කටයුතු කරගෙන යනගමන් හොඳ නිර්මාණවලට අවස්ථාව ලැබුණොත් දායක වෙනවා. දිගටම රංගනයේ යෙදෙන්න තමයි ආසාව තියෙන්නේ. බලමු ඉතින් ඉස්සරහට.

**●ගෙදරින් ලැබෙන සහයෝගය කොහොමද?**

ගෙදරින් ලොකු සහයෝගයක් ලැබෙනවා. විශේෂයෙන් මතක් කරන්න ඕනේ මගේ නැන්දාව. මුලින්ම අප්පච්චි කැමති වුණේ නැහැ. මම අවුරුදු කුමාරි තරඟයට යනවට. නැන්දා තමයි අප්පච්චිට කිවුවේ මෙයාට අවස්ථාවක් දෙමු කියලා. නැන්දා තමයි මට පාර හදලා දුන්නේ එදා අවුරුදු කුමරි තරඟයට යන්න.

ඒ වගේම නංගිත් මට ලොකු සහයෝගයක් ලබා දෙනවා. ෂූටින් යද්දී මගේ තනියට එයත් එනවා. ඒ එක්කම කැම්පස් එකේ මගේ යාළුවො මතක් කරන්න ඕනේ. මම කැම්පස් එකේ හොස්ටල් එකේ ඉඳලා ෂූටින් යද්දී එයාල එනවා මගේ තනියට. මගේ ගමනට මගේ යාළුවො තුන්දෙනාගෙන්ම ලොකු සහයෝගයක් ලැබෙනවා. ඒ හැමෝම හරිම ආදරෙන් මතක් කරනවා.

**●අනාගත බලාපොරොත්තු මොනවාද?**

උසස් අධ්‍යාපනය ලබන ක්ෂේත්‍රය ඔස්සේ ඉදිරියටම යන්නයි මගේ බලාපොරොත්තුව. ඒ එක්කම කවදා හරි සම්මානනීය නිළියක් වෙන්න ලොකු ආසාවක් තියෙනවා.

**●ප්‍රේක්ෂකයන්ට මොන වගේ දෙයක් ද කියන්න තියෙන්නේ?**

තවම මට ලොකු ප්‍රේක්ෂකයින් පිරිසක් නැහැ. ප්‍රේක්ෂකයින්ගෙන් ලැබෙන ප්‍රශංසා සහ විවේචන මම හරිම ආදරෙන් භාර ගන්නවා. මම මේ මොහොතේ ප්‍රේක්ෂකයින්ගෙන් ඉල්ලන්නේ මගේ අඩුපාඩු තියෙනවා නම් පෙන්වා දෙන්න කියලා.

# ආදරේ නොකියාම මාස තුනක් වගේ කෙටි කලකින් අපි විවාහ වුණා



**කලින් මම ආදරේ කළේ නිත්‍යා වගේම හැඩහුරුකම් තියෙන නිළියකට**

► හර්ෂණී වීරරත්න

**රංගන ශිල්පීන් චරිත සඳහා ජනතාවගෙන් නොමඳ ආදරයක් ලබනවා සේම ඒ චරිතයට ජනතා අප්‍රසාදය හෝ බැන වදිනවා නම් නළුවා හෝ නිළිය එම චරිතය සාර්ථක ලෙස කැමරාව ඉදිරියට ගෙන ආවා කියන එකට සැකයක් නැහැ. පාර දිගේ නාට්‍ය රුවිනී වුණු නිත්‍යා දේවින්දිත් මේ දවස්වල ඒ විදිහට නිතරම බැණුම් අහන චරිතයක් බවට පත් වෙලා. සැබෑ ජීවිතයේදී ඇය කොයි වගේද කියලා ඇසුව සැණින් ඇයගේ ආදරණීය සැමියා වූ ගීත් ද සොයිසා කිව්වේ කතා දෙකක් නැහැ නපුරැයි කියලයි. ඔහුත් ජනප්‍රිය නාට්‍ය කිහිපයක නිෂ්පාදකවරයෙක්. ඒ නිසා ඔවුන්ගේ රසබර තොරතුරු මේ විදිහට රසඳුන පිටු අතරේ තැබුවා.**

**●මේ දවස්වල හරියට බැණුම් අහනවා නේද නිත්‍යා..?**

ඒකනේ. ෆොටෝස්වත් දාන්න බැහැ. ඒක යටින් කමෙන්ට් කරලා බණිනවා. පාර දිගේ නාට්‍යයේ රුවිනිට කවුරුත් ආදරෙන් කතා කරන්නේ නැහැ. සමහර අය හොඳට බැණලා බැණලා පස්සේ කියනවා ඔයා චරිතය හොඳට කරන නිසානේ අපිත් බණින්නේ කියලා.

**●මිනිස්සු බණිනකොට දුක හිතිලා නැද්ද ..?**

මුල් දවස්වල නම් හරිම දුකයි. දුක හිතුනම මම ප්‍රවීණ රංගන ශිල්පිනී මල්කාන්ති මහත්මිය එක්ක කතා කරනවා. මල්කාන්ති අක්කා තමයි පාර දිගේ නාට්‍යයේ මගේ අම්මට රඟපාන්නේ. එයා කියනවා ඔය මොකක්ද මම මේ අවුරුදු 40 ක් තිස්සේ බැණුම් අහන්නේ. ඔයා ඔය චරිතය හරියට කරන නිසා තමයි ජනතාව මෙච්චර ප්‍රතිචාර දක්වන්නේ. ඕවා වැඩිය බලන්න එපා. ඔයාට වඩා හොඳට මේ චරිතය වෙන කෙනෙකුට කරන්න බැහැ කියලා මල්කාන්ති අක්කා කිව්වා. එයත් එක්ක කතා කළාට පස්සේ මගේ හිත හැදුනා. දැන් නම් සමහර කමෙන්ට් දකිද්දී හිනා යනවා.

**●ඔබ අවිවාහකයි කියලා හිතලා ආදරේට යෝජනා කරන අයත් ඇති..?**

මම වැඩිය ශෝෂල් මීඩියා පාවිච්චි කරන්නේ නැහැ එන මැසෙජ් බැලෙන්නෙ නැහැ . ඒ නිසා එහෙම යෝජනා කරලා තියෙනවා ද කියලා දකින්නේ නැහැ . නමුත් මේ ළඟදි දවසක හස්බන්ඩ් එක්ක ගත්ත ෆොටො එකක් ස්ටෝරිස් දැම්මා. ඒකට පිරිමි ළමයෙක් කමෙන්ට් කරලා තිබ්බා එයාගේ නොවුණා නම් ඔයා අනිවාර්යයෙන්ම මගේ වෙලා කියලා. ඒක දැකලා අපි දෙන්නට හිනා ගියා.

**●නිත්‍යා රංගනයට පිවිසිලා කෙටි කාලයක් වෙන්නේ. නිළියන් ට වැඩිපුරම අයුතු යෝජනා කරන අයත් ඉන්නවලුනේ. ඔබටත් එහෙම යෝජනා කරපු අය හිටියද..?**

මම රංගනයට ආපු මුල්ම දවස්වල එක නළුවෙක්ගෙන් අමුතු යෝජනාවක් ආවා. මට ඒකට හරි අවුල් ගියා. මම දන්නවා මම ඉන්න ඕන විදිහ හා ඒ වගේ අවස්ථාවල දි මම කොහොමද උත්තර දෙන්නේ කියලා. කියන්න ඕන ටික ඔහුට කිව්වා. පස්සේ බලාගෙන යද්දී ඒ නළුවා ඒ යෝජනා මට විතරක් නෙමෙයි කරලා තියෙන්නෙ. අයුතු යෝජනා නොකරපු නිළියක් නැතිලු. ඇම දාලා බලන අය ඉන්නවා. ඇමට අහුවෙලා කනවද නැද්ද කියලා තීරණය තියෙන්නේ අපේ අතේ. මම හරි පරිස්සමින් ජීවත් වෙන කෙනෙක්. ඕනැවට වඩා කරේ එල්ලීලා කතා කරන්න යන්නේ නැහැ. එහෙම වුණොත් තමයි ප්‍රශ්න එන්නේ. ක්ෂේත්‍රයේ ගොඩක් අය ගීත්ව දන්න නිසා දැන් ප්‍රශ්න නැහැ.

**●ගාල්ලේ ඉඳලා කොළඹට එන නිත්‍යා නිළියක් වෙන්නේ මවුපියන්ගේ කැමැත්තට කියන්නේ ඇත්ත ද ..?**

ඔව්. මම දෙරණ අවුරුදු කුමරිය තරගයෙන් අවසන් දොළොස් දෙනා අතරට තේරෙනවා. ඒක යන්නෙත් මගේ කැමැත්තට නෙමෙයි. මගේ අම්මා අයියා නංගිගේ ආසාවට. ඉස්කෝලේ කාලේ ඉඳලා කලා කටයුතු වලට සම්බන්ධ වුණු නිසා මාව ඒ පැත්තට තල්ලු කළා. කිසිම ආසාවක් නැතුව මමත් සම්බන්ධ වුණා . මගේ තාත්තා නැති වුණා 2018 අවුරුද්දේ. වෙන අම්මලා තාත්තලා ඕවට කැමති නැහැනේ. ඒත් එයාලා එහෙම නැහැ . බල කරා යන්න. දෙරණ ට සම්බන්ධ වුණු නිසා රංගනයට අවස්ථාව ක් ලැබුණා. ඒ 2019 අවුරුද්දේ අන්තිමට. ඒ පටන් ගත්ත ගමන තමයි මේ තවත් යන්නේ. දැන් පවුලේ අයට හරි සතුටු යි. එයාලා මාව තල්ලු කළේ නැත්තම් මම තවම ගාල්ලේ.



**ගීත් මාව ඉක්මනින් බැන්දේ කලින් තිබ්බ අත්දැකීම් නිසා තමයි**

**●තරගකාරී ජනප්‍රිය රැල්ලට එන බොහෝ අය ජනප්‍රියත්වය මේන්ටේන් කරනවා..?**

මට එහෙම උණක් නැහැ . අනේ මගේ නම රූපේ මිනිස්සුන්ට අමතක වෙයි කියලා නටන්නේ නැහැ. ඕන වෙලාවක අත ඇරලා ඉස්සර හිටියා වගේ ඉන්න පුළුවන්. මේක තාවකාලිකයි. මේන්ටේන් කරාට වැඩක් නැහැ .

**●ඒ වුණාට ඔබ නිළියක් වුණු නිසානේ ගීත් වගේ කෙනෙක් මුණගැහෙන්නේ ..?**

ඒක ඇත්ත . ගීත්ව මට මුණගැහෙන්නේ මම රංගනයට ආපුම කාලේ. මම ජනප්‍රිය නැහැ . දැන් ටිකක් හරි ජනතාව දන්නේ පාර දිගේ නාට්‍ය නිසා. ජනප්‍රියත්වයක් නැති කාලේ හම්බුණ ගීත් මාව හරි ආදරෙන් එයාගේ ජීවිතේට එකතු කර ගත්තා. අපි හමුවෙන්නේ රණවිරු සෙවණ ඉවෙන්ට් එකකට එයා මට ආරාධනා කරලා. මම ගාල්ලේ හිටියේ. මෙයා මට ඉවෙන්ට් කිහිපයකට ආරාධනා කරා එන්න බැරි වුණා. ඊට පස්සේ කොහොම හරි යන්න ඕන කියලා ගියා. එදා එයාගේ වාහනේ තමයි මාව දාගෙන ගියේ. මම යාළුවෝ එක්ක ගියේ. ටික දවසකට පස්සේ අපි බඳින්නේ කවදාද ඇහුවා. මම අහ් බඳින්නේ කියලා අහද්දි එයා ඔව් කිව්වා. මම කිව්වා ඔක්කොටම කලින් ගෙදරින් අහන්න කියලා . අන්තිමට ආදරේ නොකියා ම විවාහ වුණා මාස තුනක් වගේ කෙටි කලකින්.







**තිබ්බ සම්බන්ධතා ඔක්කොම බලද්දී නිත්‍යා කියන්නේ හාත්පසින්ම වෙනස් මාරම චරිතයක්**

**●ගීත් ආදරේ ප්‍රකාශ නොකර විවාහයට යෝජනා කරද්දී නිත්‍යා ප්‍රතික්ෂේප කරයි කියලා හිතුනේ නැද්ද ..?**

මොන පිස්සු ද මම අහන්නේ කොයි වෙලෙඳ කියලා එයා බලාගෙන ඉන්න ඇති. නැත්තම් අහපු ගමන් හා කියන්නේ නැහැනේ.

**●ඇත්ත ද නිත්‍යා ..?**

මම හා කියනකල් දවස ගානේ පස්සෙන් ආවා. දැන් ඔහොම ගීත් කිව්වට. ඇත්තටම අකමැති වෙන්න හේතුවක් තිබ්බෙ නැහැ ඒකයි යෝජනාවට හා කිව්වේ.

**●විවාහ වුණාට පස්සේ ගීත් කිව්වේ නැද්ද රඟපෑවා ඇති කියලා ..?**

එයා එපා කියලා නැහැ. ඒ වුණාට අකමැත්තක් තිබ්බා එයාට කලින් තිබ්බ ආදර සම්බන්ධතාවල අත්දැකීම් එක්ක. නමුත් මම ඉන්න විදිහ හැසිරෙන විදිහ එක්ක එයාගේ ඒ අකමැති ගතිය නැතිවෙලා ගියා.

**●ගීත්ට නිළියෝ ගොඩක් එක්ක පැටලිලා අත්දැකීම් තිබ්බ නිසා නිත්‍යා නැති වෙයි කියන බයටද ඉක්මනින් විවාහ වුණේ..?**

ඔව්. අනිත් එක කොවිඩ් කාලේ වෙඩින් ලොකුවට ගන්න බැහැ. කොවිඩ් මුවාවෙන් ඉක්මනින් බැන්දා. ලොකුවට වියදම් කරන්න ඕන නැහැ නේ. ආදරේ අමිහිරි අත්දැකීම් තිබ්බා. ඒකත් එක හේතුවක් ඉක්මනින් බඳින්න.

**●විවාහය කොළයකට සීමා වුණා කියලා යන කෙනා යනවනේ, නිත්‍යා ගැන එහෙම බයක් තිබ්බේ නැද්ද ..?**

එහෙම බයක් නම් කොහෙත්ම ආවේ නැහැ , ආශ්‍රය කරද්දී තේරුණා. ගති ගුණත් හොඳයි. මම හරි ආදරේයි. එයා හරි ලෝබ කෙනෙක් ආදරේට, ඒ දෙවල් එක්ක බයක් දැනුනේ නැහැ. තිබ්බ සම්බන්ධතා ඔක්කොම බලද්දී නිත්‍යා කියන්නේ හාත්පසින්ම වෙනස් මාරම චරිතයක්. වාසනාවක් එයා වගේ කෙනෙක් ලැබීම.

**●එතකොට නිත්‍යාට හැඩ හුරුකම් තිබ්බ නිළියකට ප්‍රේම කරලා ඒ ප්‍රේමය අහිමි වුණු නිසා නිත්‍යාට හිත ගියා කිව්වොත්..?**

නිත්‍යා වගේම නිළියක්ට ආදරේ කළා. එයා වෙන ආදරේක පැටළුණා. එයාගේ හැඩහුරුකම් තිබ්බට එයා නිසා නිත්‍යාව තෝරා ගත්තේ නැහැ. නිත්‍යාව දකිද්දී ආදරේ කරන්න හොඳයි කියලා හිතුනා. අර නිළිය ළඟින් නිත්‍යාව තියන්නත් බැහැ ඒ තරම් නිත්‍යා හොඳයි.

**●නිත්‍යා පාර දිගේ රුවිනි වගේ නපුරැයි ද..?**

නපුරුද කියලත් අහනවා. කතා දෙකක් නැහැ ඒ වගේ නපුරුයි තමයි. හැබැයි හරි හොඳයි.

**●රේස් එක දෙක කියන නාට්‍ය නිෂ්පාදනය කරා ඔබ. ඒ සඳහා ඔබේ බිරිය යොදා ගත්තා. බිරිඳට රගපාන්න දෙන්න ඕන නිසාද ඔබ නිර්මාණය කරන්නේ ..?**

එයා නිසා මම නිර්මාණ නිෂ්පාදනය කරන්නේ නැහැ, නමුත් පවුලේ අය හිටියම හරි ලේසියි වැඩ කරන්න. ඒ නිසා බිරියට ගැළපෙන චරිතයක් බලලා දුන්නා. මම මගේ පළමු ටෙලි නාට්‍ය අධ්‍යක්ෂණය පටන් ගන්නවා. ඒකට එයාව ගත්තේ නැහැ . චරිත ගැළපෙන ඒවා නොතිබ්බ නිසා.

**●පාර දිගේ රුවිනි ගැන මොකද හිතන්නේ ..?**

ඇත්තටම කිව්වොත් නිත්‍යා ඒ නාට්‍යයෙන් ප්‍රතික්ෂේප කරපු කෙනෙක්. එයාට ඒ අවස්ථාව දෙන්න බැහැ සාර්ථකව කරන්න බැහැ කියලා කිව්වා. නමුත් ප්‍රධානියෙක්ගේ ඉල්ලීමකට නිත්‍යාට ඒ චරිතය දුන්නා. දැන් ප්‍රතික්ෂේප කරපු කෙනත් කියනවා රුවිනිට නිත්‍යා සාධාරණයක් කරනවා කියලා . ඔහුත් අගය කරන එක වටිනවා. රුවිනි වගේම නිත්‍යාටෙ දෙන ඕනෑම චරිතයක් කරන්න පුළුවන් කියලා මට විශ්වාසයි.

**●ඔබේ මල්ලි විවාහ වුණොත් නිළියක් එක්ක චතූ රාජපක්ෂ එක්ක. අයියයි මල්ලියි එක වගේ නිසා කාටවත් දෙන්නව පැටලිලා නැද්ද ..?**



චතූටයි නිත්‍යාටයි අපි දෙන්නව පැටලිලා නැහැ. නමුත් නිත්‍යාට කෝල් කරලා තියෙනවා ඔයාගේ හස්බන්ඩ් වෙන කෙනෙක් එක්ක යනවා දැක්කා කියලා. චතූට කෝල් කරලත් ඒ වගේම කියපු අවස්ථා තිබ්බා. අපි නිවුන්නු නෙමෙයි. අපි දෙන්නා අවුරුදු පහකට බාලයි. ඒත් ටිකක් එක වගේ.

**●ඒකද ඔහුත් නිළියක් බැන්දේ? ඒ දෙන්නා මුණගස්වන්නේ ඔබට නිත්‍යා මුණගැසුණු දවසේමයි..?**

ඒකනේ අන්තිමට මල්ලිත් නිළියක් බැන්දා. අපි හැමෝම සම්බන්ධ වුණේ එකම ඉවෙන්ට් එකට තමයි. නමුත් වෙන වෙනම. චතූව ගන්න රාජකාරි ය මල්ලිට දුන්නා මම නිත්‍යා ව ගත්තා. ඊට පස්සේ අපි හැමෝම එකට සෙට් වුණා අවස්ථා කිහිපයකදි. නිළියෝ ම ආශ්‍රය කරපු අපි දෙන්නට අන්තිමට නිළියෝ ම බඳින්න වුණා.

**●ඔබේ මවුපියන් විරුද්ධ වුණේ නැද්ද නිළියෝ කරකාරෙට ගන්න ..?**

නැහැ . ඔක්කොම ප්ලෑන් කරලා කිව්වේ. කිසිම විවිරුද්ධත්වයක් තිබ්බේ නැහැ.


**●නිත්‍යාට ලැබෙන ප්‍රතිචාර එක්ක සාමාන්‍ය ජීවිතයක් ගත කරන්න ගීත්ට අපහසුයි කියලා දැනිලා නැද්ද ..?**

දැනිලා තියෙනවා . එයා එක්ක පාරේ යන්න බැහැ ෆොටෝස් ගන්න එනවා. සමහර වෙලාවට පැත්තක ඉන්න මාවත් එකතු කර ගන්න එක තමයි මම අකමැතිම දේ. එය එක්ක ඕන කෙනෙක් ෆොටෝස් ගත්තට කමක් නැහැ. සමහර අවස්ථා තියෙනවා නිදහසට බාධා වෙන . දැන් ඉතිං එහෙම කියලා මොනවා කරන්නද. බැන්දේ නිළියක් නේ.



**මාවයි මල්ලිවයි පැටලිලා චතූට කෝල් කරලා කියනවා ඔයාගේ හස්බන්ඩ් වෙන කෙල්ලෙක් එක්ක ගියා දැක්කා කියලා..**

**නිත්‍යා දේවින්දිගේ සැමියා ගීත්**



හද කොනිත්තන
නෙතු ඇසිල්ලක
කඳුළු හැංගුණු ස්නේහයේ...
චපල හිතකට
පෙම් කෙරූ මට
උරුම දුකම ද ජීවිතේ..

ළඟම ඉන්නට ඉහ ළඟින්
පෙරුම් පිරුවේ මුළු හදින්...
සුසුම් සුළඟේ දිව ගිහින් පැන
කඳුළ විතරක් ළඟ තියන්..

මලක් වී මම නුඹ ළඟින්..
පිදුවෙ විකසිත සුවඳ පැන්
බඹර කුලේ බඹරිඳු
ලෙස පැන දුවන
බව නොදැන මං...

පද - දර්ශ කපුගේ
සංගීතය - ගයාත්‍රී කේමදාස
ගායනය - රේෂ්මා පෙරේරා

# ගීත ලියන චිත්‍ර ශිල්පියාගේ අලුත්ම ගී සිතුවම

# බඹර කුලේ

**▶ ඉනෝකා සමරවික්‍රම**

**ආදරයෙන් බැඳෙන්නේ ආදරණීය සිත්ය. හැඟිම් බැඳීම් එක්ක එක්වන සිත් ජීවිතය අවසන් වනතුරුම ආදරයෙන් බැඳී තියේ. එහෙත් ආදරය යැයි කියා ආදරය ළඟ තැවෙන දැවෙන රැවටෙන සිත්ද නැතිවාම නොවේ. ආදරයෙන් පැරදී ඒ වෙනුවෙන් තැවෙන දැවෙන හිතක් ළඟ නතර වී ලියූ කතාවක් බඳු ගීතයක් පසුගිය දිනවල මුහුණු පොතින්, යූ ටියුබයෙන්, විවිධ ගුවන්විදුලි නාළිකා ඔස්සේත් අසන්නට දකින්නට ලැබුණා. ඒ අපේ මිත්‍රයකු වන කලක් දිනමිණ පුවත්පතේ චිත්‍ර ශිල්පියකු ලෙස සේවය කළ දර්ශ කපුගේ ලියූ**

**"හද කොනිත්තන
නෙතු ඇසිල්ලක
කඳුළු හැංගුණු ස්නේහයේ...
චපල හිතකට
පෙම් කෙරූ මට
උරුම දුකමද ජීවිතේ.. යන ගීතයයි.**

දවසින් දවස අලුත් ගීත බිහිවෙන කලා ලොවේ මේ අලුත් ගීතය ද බොහෝ රසිකයන් ආදරයෙන් වැලඳගත් බව නම් නොරහසකි.

පුවත්පත් කලාවේදියෙක්, චිත්‍ර හා කාටුන් ශිල්පියෙකු ද වන දර්ශ ගීතය ලියන්නට පෙලැඹුණේ මීට කලකට පෙරය. "බඹර කුලේ" නමින් පසුගියදා එළිදැක්වූ මේ ගීතය ගයන්නේ සංගීත ශිල්පිනි රේෂ්මා පෙරේරාය. ඇය නැසීගිය ප්‍රවීණ ගායන ශිල්පී සෙල්ටන් පෙරේරාගේ දියණිය වේ. ගීතය සංගීතවත් කර ඇත්තේ කේමදාස මාස්ටර්ගේ දියණිය වන ගයාත්‍රී කේමදාසය.

මේ ගීතය පිළිබඳ අප විමසූ විට දර්ශ අප හා කියුවේ මෙවැනි කතාවක්.

"මම මීට පෙරත් ගීත කිහිපයක් ම ලියා තිබෙනවා. අද අපට අසන්නට විඳින්නට ලැබෙන්නේ ඒකාකාරි ගීත කලාවක්. ඔය අතරේ තමයි මට හිතුණේ වෙනස්ම ගීතයක් ලියන්න ඕන කියලා. මේ ගීතය විරහා ගීතයක්. දෑස් අඳ ගැමි තරුණියක හා ප්‍රේමයෙන් බැඳෙන ඒ ගමේම සල්ලාල තරුණයකු ඇයව මුළාකර පලායන අයුරු තමයි මට ගීතයෙන් කියන්න ඕනෑ වුණේ. ඒ අදහස මූලික කරගෙන ලියැවුණ මේ ගීතය ටික කලක් මා ළඟම තිබුණා. රේෂ්මා පෙරේරා. මම ගීතය ලිව්වෙත් ඇගේ ඉල්ලීමකට. රේෂ්මා කියන්නේ මගේ දිගුකාලීන යෙහෙළියක්. ඒ වගේම ගීතයේ සංගීතය නිර්මාණය කරන්නේ ගයාත්‍රී කේමදාසයන් විසින්. ගයාත්‍රී හරි අපූරුවට ගීතයම සංගීතවත් කරනවා. ඒ නිසාම තමයි ඉතාම කෙටි කලකින් මේ ගීතයට රූප රචනාවක් සැකසෙන්නේ. මම කලකට පෙර චිත්‍රපට කිහිපයකම සහාය අධ්‍යක්ෂකවරයෙක් ලෙසත් කටයුතු කර තිබෙනවා. ඒ වගේම ගීත කිහිපයකටම රූප රචනය කර තිබෙනවා. ඒ නිසා මේ ගීතය සඳහා මමම රූප රචනාව කරන්න ඕනෑ කියා හිතුණා. මට ඕන වුණේ ගීතයේ පදවලට නිර්මාණාත්මක වෙනසක් කරන්න. ඒ වෙනස කිරීමේදී මම සාර්ථකයි කියලා අද මට හැඟෙනවා ...දැනෙනවා. එහෙම හැඟෙන්නේ ... දැනෙන්නේ ගීතයට ලැබෙන යහපත් ප්‍රතිචාර නිසයි. ඒකාකාරි ගීත අතර වෙනස්ම ගීතයක් කරන්නට ගත්ත උත්සාහය සාර්ථකයි කියන හැඟිම අද මට තියෙනවා. බඹර කුලේ ගීතය වෙනස්ම නිර්මාණයක්.

බොහෝ දෙනෙක් ඒ ගීතය ශ්‍රවණය කිරීමෙන් නැරඹීමෙන් ඒ ගැන දක්වන ප්‍රතිචාරවලින් මට මගේ සාර්ථක බව දැනෙනවා. මෙහිදි කැමරා අධ්‍යක්ෂණයෙන් ජනිත් සුසෙව්හේවාද, සංස්කරණයෙන් භවන්ත ගමගේ, වේශ නිරූපණය මනීෂා යන අයගේ සහාය අපට ලැබුණා. ඒ හැරුන විට 'බඹර කුලේ' ගීත රූප රචනාවට සචිනි යකුපිටිය සහ විශ්මිත ප්‍රභාත් යන නැගී එන නළු නිළි දෙපළ වගේම ළමා නිළි සයුනි විහන්සා රංගනයෙන් දායක වෙනවා. මේ ලැබෙන ප්‍රතිචාරත් සමඟ තවත් ගීත නිර්මාණය කරන්න හරි අපූරු දිරියක් ලැබෙනවා."

ගීතයේ පසුබිම් කතාව හා ඒ වටා පිටාව ගැන විමසූ විට දර්ශ දුන්නේ එවන් පිළිතුරකි.





ගයාත්‍රී කේමදාස



දර්ශ කපුගේ



රේෂ්මා පෙරේරා







# ප්‍රේක්ෂකයන්ගේ ආදරේ ගොඩක් වටිනවා

▶ නාමලී ගමගේ

**ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර වුණු ඉන්දික ෆර්ඩිනැන්ඩෝගේ හෝ ගානා පොකුණ චිත්‍රපටය පුරා දිස්වුණේ කවදාවත් මුහුද දැකලා නැති අහිංසක මල් වැනි පොඩිත්තන්ගේ හැඟීම්ය. ඒ අතරේ කවදාවත්ම මුහුද දැකගන්න බැරි අන්ධ දැරිවියකුත් හිටියා ඔබට මතක ඇති. තමන්ට මුහුද දැනෙන විදිහ ඇය විස්තර කළේ නරඹන්නන්ගේ නෙතට කඳුළක් එක් කරමිනි. ඇයගේ රංගනය එතරම්ම තාත්විකය. ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර වුණු ඒ කුඩා දැරිය අද රටම දන්නා යෞවනියකි. ගීතයට පෙම් බඳින ප්‍රේක්ෂකයන්ගේ සිහින කුමරියකි. අංජලී මෙත්සරා නම් වූ ඇය සමඟයි අද අපේ කතාබහ.**

**●අංජලී මෙත්සරා කොහොම ද මේ දවස්වල ජීවිතේ?**

මේ දවස්වල මගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කාලය වෙන් කර තියෙන්නේ. පසුගිය දිනවල නිමාවට පත්වුණු ලිට්ල් ටයිට්න් වැඩසටහනේ නිවේදිකාවක් විදිහට කටයුතු කළා. එයට ගොඩක් හොඳ ප්‍රතිචාර ලැබුණා. ටෙලි නාට්‍ය පසුබිම් ගායනයත් කරගෙන යනවා. ඒ හැරුණු විට චිත්‍රපටයකට වගේම ටෙලි නාට්‍ය දෙකකටත් ආරාධනා ලැබුණා. ඒවාට සම්බන්ධ වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**●ඔබේ වැඩි කැමැත්ත තියෙන්නේ ගායිකාවට ද? නිළියට ද? නිවේදිකාවට ද?**

මට ඒ තුනම සමබරයි. ඊටත් වඩා මං කැමති චිත්‍ර අඳින්න.

**●එතකොට අංජලී ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නේ කොහොමද?**

මුලින්ම මං සම්බන්ධ වුණේ දෙරණ ලිට්ල් ස්ටාර් වැඩසටහනට. ඒ 2011 වර්ෂයේ. වයස අවුරුදු 8න් පහළ ගායන අංශයේ දක්ෂතම පුංචි තරුව බවට පත්වුණා. මගේ ගීත කිහිපයක්ම 2018 රාජ්‍ය සංගීත සම්මාන උළෙලට නිර්දේශ වුණා, ප්‍රශස්තතම ළමා ගායිකාව විදිහට. ඊට පස්සේ තමයි 2015 වසරේදී ප්‍රදර්ශනය වුණු 'හෝ ගානා පොකුණ' චිත්‍රපටයට සම්බන්ධ වුණේ. පුවත්පත් දැන්වීමකට අනුව ඔඩිෂන් ගිහින් තමයි ඒකට තේරුණේ. මම එහි අන්ධ දැරියගේ චරිතය නිරූපණය කළේ. ඒකට ගොඩක් හොඳ ප්‍රතිචාර ලැබුණා. චිත්‍රපටය ජාත්‍යන්තර සම්මාන උළෙලවල සම්මානයට පාත්‍ර වුණා. ඒ වගේම මට හිරු ගෝල්ඩන්, සිග්නිස් වගේම ජනාධිපති සම්මානත් හිමි වුණා.

**මම රස්සාවක් කරන්න නම් කැමැත්තක් නැහැ**

**●ඔබේ මුල්ම රංගන අත්දැකීම අන්ධ චරිතයක්. ඒක අභියෝගයක් වුණේ නැද්ද?**

ඒ දවස්වල එතරම් තේරුමක් තිබුණෙ නැති නිසා බය කියන එක දැනුණේ නෑ. අධ්‍යක්ෂවරයා කියූ විදිහට උපරිම දේ කළා. මා රඟපෑ චරිතය සාර්ථක වීමේ ගෞරවය හිමිවෙන්න ඕන අධ්‍යක්ෂවරයාට.

**මා රඟපෑ චරිතය සාර්ථක වීමේ ගෞරවය හිමිවෙන්න ඕන අධ්‍යක්ෂවරයාට**

**●දෙරණ ඩ්‍රීම් ස්ටාර් සීසන් 10වල අවසන් තුන්දෙනා අතරේ අංජලී හිටියා. බොහෝ දෙනාගේ බලාපොරොත්තුව වුණේ ඔබ ජයග්‍රාහිකාව වෙයි කියලා. ඒත් එය වෙනස් වුණා. කොහොමද ඒ අවස්ථාව දැනුණේ?**

අවසන් තුන් දෙනා අතරට ආවම ගොඩක් සතුටු හිතුණා. තුන් දෙනාම එක හා සමානව හිටියේ. අපි එකිනෙකාට කියා ගත්තා ඔයා තමයි දිනන්නේ කියලා. ඒත් අපිට කවුරු දිනයිද කියලා හිතාගන්න බැරි වුණා. මිනිස්සුන්ගේන් ලැබුණු ඒ ආදරය කවදාවත් අමතක කරන්න බෑ.

**●දුලංග සහ ඔබ බැට්ල් රවුන්ඩ් එකේදි ගැයූ හින්දි සින්දුව වගේම ඔබ දෙදෙනා සහ පැතුම් එක්ව ගායනා කළ 'සීතල පින්නේ' ගීතය යූටියුබ් ගොඩක් ජනප්‍රිය වුණා නේද?**

ඔව්. ඒ සින්දු දෙකම ගොඩක් ජනප්‍රිය වුණා. 'සීතල පින්නේ' සින්දුව ජනප්‍රිය වෙන්න අපි තුන්දෙනාගේ රංගනයත් හේතුවක් වෙන්න ඇති කියලා හිතෙනවා. ඒ දෙකටම මිලියනයකට අධික ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබිලා තිබුණා.

**●අංජලී මෙත්සරාට රියැලිටි වැඩසටහනේදි විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලැබුණා. කොහොමද එළියෙදි ලැබෙන ප්‍රතිචාර?**

ටී.වී එකේ මාව ලොකුවට පෙනුණට ඇත්තටම මං පෙනුමෙන් හරි පුංචියි. ගොඩක් දෙනකුට අඳුනගන්න බැරි වෙනවා. දෙතුන් පාරක් බලලා ටිකක් වෙලා ගිහින් තමයි ආහ් මේ අංජලී නේද කියලා අඳුනගන්නේ. ගොඩක් හොඳ ප්‍රතිචාර ලැබෙනවා. ප්‍රේක්ෂකයන්ගේ ආදරේ ගොඩක් වටිනවා.

**●සැලෙනා නුවන් ටෙලි නාට්‍යයේ තේමා ගීතය මේ දවස්වල ගොඩක් ජනප්‍රියයි නේද?**

ඔව්. ඒකට ගොඩක් හොඳ ප්‍රතිචාර ලැබෙනවා. ඒකෙම තවත් සින්දු 4 ක් කළා. ඊට අමතරව ෆැලන් ඇන්ඩ්‍රියා අක්කත් එක්ක රාජිණී ටෙලි නාට්‍යයේ තේමා ගීතය ගායනා කළා.

**●ඔබේම සින්දුවක් කරන්න හිතුවේ නැද්ද?**

ළමා ගීත නම් 6ක් විතර කරලා තියෙනවා. ඊට අමතරව ඩ්‍රීම් ස්ටාර් අවසන් කිහිප දෙනා යොදාගෙන එෆ්. එම්. දෙරණින් ගීත කිහිපයක් කළා. චන්ද්‍රා සොබා කියන ගීතය මං ගායනා කළා. මම ලියපු සින්දුත් තියෙනවා. ඒ වගේ සින්දුවක් කරන්න ලොකු බලාපොරොත්තුවක් තියෙනවා.

**●අනාගතේ මොන පැත්තෙන් ද ඉදිරියට යන්න බලාපොරොත්තුව?**

කලා කටයුතුත් එක්ක බිස්නස් එකක් කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ. මම රස්සාවක් කරන්න නම් කැමැත්තක් නැහැ.





# තාත්තා තල්ලු කළෙත් නැහැ එයා නිසා අවස්ථා ලැබුණෙත් නැහැ

**තාත්තා වගේම මමත් පොළොවේ පය ගහලා ජීවත් වෙන්නෙ**

▶ හර්ෂණී වීරරත්න

**සතියේ දින පහේම තාත්තයි දුවයි එකම නාට්‍යයක දකින්න ලැබුණත්, තාත්තා නළුවෙක් විදිහට ජනප්‍රිය වෙද්දී දුව නිවේදිකාවක් විදිහට ජනප්‍රිය වුණා. ඒත් මේ දෙන්නා තාත්තයි දුවයි කියලා දන්නේ මෑතකදී. ඒ ආනා ර්ට්ස් නිසා. ඒ දෙන්නා එකතු වෙලා කරන බර්ගර් ශොප් එක නිසා. ඒ වෙන කවුරුත් නෙමෙයි ප්‍රවීණ රංගන ශිල්පි ආනන්ද අතුකෝරල හා ඔහුගේ ආදරණීය දියණිය ඉෂාරා අතුකෝරල. මේ කතාබහ ආනා ර්ට්ස් එක්ක හැමෝම කතා කරන තාත්තයි දුවයි ගැනයි.**

**● ඉෂාරා මේ දවස්වල ජනප්‍රිය නිළියක් නිසාවත් නිවේදිකාවක් නිසාවත් නෙමෙයි. වීදි කෑම ව්‍යාපාරයක් නිසයි, ආනා ර්ට්ස්ට ලැබෙන ප්‍රතිචාර කොහොමද ..?**

අපෙන් සබ්මැරින් ගන්න ආපු කෙනෙක් ෆොටෝස් එකක් පේජ් එකක දාලා. ඊට පස්සේ යූ ටියුබ් නාළිකාවකින් මගෙන් ඒ ගැන ඇහුවා. මම ඉතිං නිකන් කතා කරා. අහපු ප්‍රශ්නවලට දුන්නු උත්තර එක්ක මගෙයි තාත්තගෙයි ෆොටෝ එකක් එක්ක ඒක වෛරල් වෙලා. ඊට පස්සේ ගොඩක් අය ඉතාම අඩුවට විකුණන කෑම ගන්න ආවා. ආනා ර්ට්ස් කා අතරත් කතාබහට ලක් වෙලා.

**● ඇයි මේ ස්ට්‍රීට් ෆුඩ් කියන සංකල්පය එක්ක ගැටෙන්න හිතුවේ, ඔබ නිවේදිකාවක් තාත්තා නළුවෙක්?**

කොවිඩ්වලට කලින් පටන් ගත්තේ කොවිඩ් නිසා නතර කරා. මගේ අම්මගේ කෑම රසයි. එයා ගෙදරට වෙලා ඉන්න නිසා මම යෝජනා කරා තාත්තා අම්මා කැමති වුණා. ඒ විදිහට තමයි කාලෙකට කලින් පටන් ගත්තේ.

අපි කලාකරුවෝ කියලා මාන්නෙන් ඉඳලා වැඩක් නැහැ. තාත්තා වගේම මමත් පොළොවේ පය ගහලා ජීවත් වෙන අය. පුළුවන් විදිහට පටන් ගන්න ඕන කොහෙන් හරි එහෙම හිතලා පටන් ගත්තේ. දැන් අපිටම කියලා සේවකයොත් ඉන්නවා. මම ස්වර්ණවාහිනයේ වැඩ කරලා කෙළින්ම එන්නේ බර්ගර් ෂොප් එකට අම්මා එක්ක එකතු වෙලා මමත් වැඩ කරනවා. ඒක ලැජ්ජා වෙන්න ඕන දෙයක් නෙමෙයි. අනිත් එක අපිට නැති ඉමේජ් එකක් අපි ඇයි හදාගන්නේ.

**● ඉෂාරා තාත්තා එක්ක එකම නාට්‍යයේ රඟපානවා. නමුත් ආනන්ද අතුකෝරලගේ දුව කියලා බොහෝදෙනෙක් දැනගෙන හිටියේ නැහැ ..?**

ඇත්ත. මුල් කාලේ කවුරුවත් දැනගෙන හිටියේ නැහැ. නමුත් දැන් දන්නවා මම තමයි ආනන්ද අතුකෝරලගේ දුව කියලා

**ලැබෙන ප්‍රතිචාර දකිද්දී අමුතු හැඟීමක් ඇති වෙනවා**

**● ඔබ ඉපදෙනකොටත් ඔබේ පියා රංගන ශිල්පියෙක්. ඔබ හීන දැක්කද ඔහු වගේ ජනතාව අතරට යන්න ..?**

තාත්තා නළුවෙක් නිසා මම නිළියක් වෙන්න ඕන කියලා කවදාවත් හීන දැක්කේ නැහැ. ඒ වුණාට නිවේදිකාවක් වෙන්න නම් ආසාවෙන් හිටියා. තාත්තා මිනිස්සු අතරේ ඉන්නවා. ආදරේ ලබනවා ඒක දැකලා සතුටු වුණා. නමුත් මාත් ජනප්‍රිය වෙන්න ඕන කියලා හිතුණේ නැහැ. ඒත් දැන් ලැබෙන ප්‍රතිචාර දකිද්දී අමුතු හැඟීමක් ඇති වෙනවා.

**● පියාගේ ජනප්‍රියත්වය හා තල්ලුවෙන්ද ඔබ කලාවට එන්නේ..?**

නැහැ. ස්වර්ණවාහිනී නාළිකාවේ වැඩසටහනක් කරන්න නිවේදිකාවන් බලනවා කියලා ඒ නාළිකාවේ ජයන්ත අයියා කිව්වා. මමත් ස්ක්‍රීන් ටෙස්ට් එකට ගියා. වෙන නාළිකාවන්වලින් ආපු දක්ෂ පළපුරුද්ද තියෙන අයත් ආවා. නමුත් තේරුණේ මාව. ඒ කොෆි ස්ටූඩියෝ විත් මුදිත ඇන්ඩ් ඉෂී කියන වැඩසටහනට. දැන් හද රැඳී පැයත් කරනවා. තාත්තා තල්ලු කරේ නැහැ. එයා නිසා අවස්ථා ලැබුණෙත් නැහැ.

**● කොහොමද පුංචි කාලේ ඔබේ පියා එක්ක ගත කළ කාලය..?**

හරි සුන්දරයි. මම පුංචි කාලේ හිටියේ නාත්තන්ඩිය ගමේ. තාත්තා උදේ පාන්දර කොළඹ යන්න හදනකොට යන්න එපා කියලා මම කකුලේ එල්ලිලා අඬලා තියෙනවා. තාත්තා මඟට ගිහිං ආව දවසුත් තිබ්බා මම නිසා. පවුලේ එකම දරුවා නිසා අම්මගෙයි තාත්තගෙයි පණ මම තමයි.

**● හුරතලේට හැදුණු එකම දරුවා ඒ වගේ හැසිරෙනකොට මොකද හිතුණේ ආනන්ද. ඔබේ කතාබහ ඒ සුන්දර මතකවලින්ම පටන්ගමු..?**

මොනවා හිතෙන්නද හරිම දුකයි. සමහර දවස්වලට මම නාට්‍ය වැඩ කරලා ගෙදර යන්නේ මහා රෑ හෝ පාන්දර. දුව ඒ වෙලාවට නැඟිටලා මාත් එක්ක සෙල්ලම් කරනවා. අපි හිටියේ නාත්තන්ඩියෙ. මම වැඩ කළේ පුත්තලම කච්චේරියේ. නාට්‍ය වැඩවලට කොළඹ යනවා. හරිම දුෂ්කර ජීවිතයක් ගත කළේ. පුත්තලමේ හිටපු කෙනෙක් වැඩ කළේ කොළඹ කච්චේරියේ. ඔහුට ඕන වුණා පුත්තලම ගෙදර ඉඳලා වැඩ කරන්න. අන්තිමට එයත් එක්ක සුහදමාරුවක් හදාගෙන කොළඹ ඇවිත් පවුලේ හැමෝම කොළඹ ජීවත් වුණා. එතකල් අවුරුදු දහයක් දුකක් වින්දා.

ඉස්සර රියසල් හෝ නාට්‍ය කරද්දී දුවවත් එක්කගෙන යන දවස් තිබ්බා. යන ගමන් නිදා ගන්නවා. ආයේ ඇහැරෙන්නේ හීනා



වෙලා. කවදාවත් කරදරයක් නොකරපු දරුවෙක්. මම වාහනයක් ගත්තේ බොහෝ කලකට පස්සේ. එයා කවදාවත් මාව ගිහිං දාන්න ගන්න කියලා නැහැ. බස් එකේ තනියම ගිහිං එයාගේ වැඩ කර ගන්නවා. මම වගේම එයත් මේ ගමන ආවේ පියවරෙන් පියවර.

**●පුංචි කාලේ ඔබ පොඩි පුතා කියලා හැමෝම කතා කරද්දී චුට්ටි කියලා කතා කරන්න කිව්වේ නළු පිස්සු ව නිසාලු නේද ..?**

හැත්තෑ ගණන්වල නොබලපු වේදිකා නාට්‍යයක් චිත්‍රපටයක් නැහැ. මම හිටියේ හොස්ටල් එකේ. හොරෙන් හරි ගිහිං චිත්‍රපට බැලුවා. මම චන්ඩියා චිත්‍රපටය බලලා ගාමිණී ෆොන්සේකා මහත්මයාට වශී වෙලා හිටියේ. චන්ඩියා එකේ එතුමා රඟපෑවේ චුට්ටිට. මටත් ඒ නිසා එහෙම කතා කරන්න කියලා මම අඬලා තියෙනවා. අන්තිමට චුටි පුතා චුට්ටි වුණා. අන්තිමට ප්‍රාදේශීය මට්ටමින් රඟපෑ මම සරත්චන්ද්‍ර එදිරිසිංහ මහත්තයාගේ වේදිකා නාට්‍යයකට සම්බන්ධ වුණා. මේ වෙද්දී නොකරපු චරිතයක් නැහැ.

**මගේ දුව කවදා හරි නිළියක් වෙනවා බලන්න ලොකු ආශාවකින් හිටියේ**

**●ඔය නළුකමට කලින් නේද පළමු ප්‍රේමය මුණගැහෙන්නේ ..?**

ඔව්. ප්‍රසිද්ධ වේදිකාවට ඇවිත් නැහැ. එයාව මට මුණගැහෙද්දි එයාගේ වයස අවුරුදු 14 යි. එයත් නාත්තන්ඩිය පාරේ යද්දී මුලින්ම දැක්කේ. ඊට පස්සේ නිතරම දකිනවා. ඒ දවස්වල එයාගේ දකුණු අතේ පොඩි ප්‍රශ්නයක් තිබ්බා. වැටිලා තෙල් බෙහෙත් බඳිනවා. ඒ නිසා අකුරු ලියන්න බැහැ. එයාට හිටියා ඩෙල්ටා කියලා හොඳ යාළුවෙක්. ඩෙල්ටා තමයි මම යවන ලියුම්වලට මෙයා වෙනුවෙන් උත්තර ලිව්වේ. ඊට පස්සේ නෙල්කාව මුණගැහෙන්න එයාගේ ගෙදර ආවා ගියා. ආදරේ කළා. මම එයාට වඩා අවුරුදු 9ක් වැඩිමල්. අපි 1984 අවුරුද්දේ විවාහ වුණා. මුලින් රස්සාවත් හම්බුණා කච්චේරියේ , රඟපාන්නත් ලැබුණා.

**●බිරියට රසට උයන්න පුළුවන් නිසා**



**ව්‍යාපාරයකුත් කොහොම හරි පටන් ගත්තා නේද ..?**

එයාගේ කෑම රසවීම විවාහ වීමටත් හේතුවක්. කෑම හරිම රසයි. මම බැන්දේ එයාගේ කෑම රස නිසා. එයාටම විශේෂ වුණු බිරියානි එකක් හදනවා. දුව තමයි ඒ යෝජනාව ගෙනාවේ අන්තිමට අපි දෙන්නාත් කැමති වුණා.

**●"ආනා ඊට්ස්" ඇයි ඒ නම දැම්මේ..?**

ගොඩක් අය මට කතා කරන්නේ ආනන්ද කෙටි කරලා ආනා කියලා. ගණ හොඳයි. ගුරු අක්ෂරය තියෙන්නේ. මම ඔය ගැන දන්න නිසා ඒ නම දැම්මා. දුවත් කිව්වා නියමයි කියලා.

**●දුව ප්‍රසිද්ධ චරිතයක් නමුත් ඇයත් කෑම හදන්න උදව් කරනවා..?**

ප්‍රසිද්ධ බව අදාළ නැහැ අපිට. එයා ස්වර්ණවාහිනියට වැඩට ගිහිං කෙළින්ම එන්නේ "ආනා ඊට්ස්" එකට. දවසක් එයා පැය හය හතක් එක දිගට හිටගෙන වැඩ. අම්මෝ කියලා කොන්ද අල්ලගෙන තප්පරයක් ඉඳලා එක දිගට වැඩ කරනවා. දැන් බිස්නස් වැඩියි. නිදහස් දවසේ වහලා තිබ්බේ. එදා කෑම හොයාගෙන එකසිය පනහක් විතර ඇවිත්. දුර පැතිවලිනුත් ඇවිත්. ඒ තරම් මේ වැඩේ ප්‍රචාරය වෙලා.

ඒ කියන්නේ දැන් බිස්නස් සරුයි..?

බඩු ඉවර වෙනකල් කෑම හදන්න ඕඩර් තියෙනවා. පෝලිමේ දහයක් විතර ඉන්න මට්ටමින් බිස්නස් සරුයි. අපි අනිත් තැන්වලට වඩා හරි අඩක්ම ගාන අඩුවෙන් රසට සාධාරණ මුදලකට දෙන නිසා බොහෝ දෙනෙක් එනවා. ගාන අඩු නිසා මුල් දවස්වල එකක් අරන් කාලා බලලා දහයක් විතර අරන් යන අයත් හිටියා. දැන් සේවකයො හතරක් ඉන්නවා. හොඳ පඩියක් දීලා ගෙදර නවාතැන් දීලා සතුටින් එයාලවත් තියන්න පුළුවන් වුණා. නිලමේ කියන යූටියුබ් නාළිකාවට ස්තූතියි කියන්න ඕන අපි වෙනුවෙන් අපි ගැන ජනතාව දැනුම්වත් කරලා බිස්නස් වැඩි කරන්න උදව් කළාට. ඒ නිසයි අපි දෙන්නා තාත්තයි දුවයි කියලා බොහෝ දෙනෙක් දැන ගත්තෙත්. මාලඹේ ස්ලිට් එක ළඟත් තව එකක් ඕපන් කළා.

**●රටේ ආර්ථික ප්‍රශ්න ගෙදරට බලපෑ නිසා වෙන්න ඇති මෙවැනි දෙයක් කරන්න හිතුවේ..?**

අවංක කතාව ඒක තමයි රඟපාලා ගන්න මුදල් මදි දැන් ජීවත් වෙන්න. ලංකාවේ ජීවත් වෙන්න අමාරු මට්ටමක තියෙන්නේ. ඒත් මොනා කරන්නද පුළුවන් දේ කරන්න ඕන ජීවත් වෙන්න . ඉස්සර රට වටේ ට්‍රිප් කීයක් ගියාද. දැන් අඩු තරමින් නෑදෑ ගෙදරක ගිය දවසක් මතක නැහැ.

**●රංගන ජීවිතේ තරුණියකට ගැළපෙන්නේ නැහැ කියන දේ ඔබ රංගන ශිල්පියෙක් හැටියට දකිද්දී එතැනට ඔබේ දියණිය යොමු කරන්නේ ..?**

මම හරි ආසාවෙන් හිටියා මගේ දුව කවදා හරි නිළියක් වෙනවා බලන්න. ඒ නිසාම එයා ඉපදෙනකොට එයාට ඉෂාරා රංගනි කියලා නම දැම්මා. නමුත් එයා ආස වුණේ නිවේදිකාවක් වෙන්න. පාසල් කාලේ නර්තනයට දක්ෂතා දැක්වුවා. කොහොම හරි එයා ආස මාවතට එයා ආවා. නිවේදිකාවක් වුණු නිසා නිළියක් වෙන්න ලැබුණා. ඔය කතාව මම දැකලා තියෙනවා. අලුතින් එන දරුවෝ නාස්ති වෙන හැටි. ඒ නාස්ති වෙන්නේ එයාලගේ වුවමනාවෙන්. මම දුවව බලා ගන්නවා. දුව එහෙම නැහැ කියලා විශ්වාස කරනවා.

**●දුවගේ අඩුපාඩු කියනවද..?**

මුල් නාට්‍යයේ රූගත කිරීම්වලට මම ගියා. බලාගෙන හිටියා . මට දැණුනු විදිහට වෙනස් වෙන්න ඕන තැන් එයාට කියනවා. දැන් ටීවී එකෙන් දකින්නේ. එයා ළඟ හිටියොත් ඒ අඩුපාඩු පෙන්නලා දෙනවා.



**අපි කලාකරුවෝ කියලා මාන්නෙන් ඉඳලා වැඩක් නැහැ**





ගීත ගායනයට එතරම් ප්‍රියතාවයක් නැහැ

# මම සංගීතය කරන්නේ මගේ ආත්ම තෘප්තිය වෙනුවෙන්

▶ අනුෂා රණසිංහ

**සිංගීතයේ නවමානයන් සොයා යමින් මෙරට ගීත ලොවට සිය ගීත නිර්මාණ තිළිණ කරන නව පරපුරේ ප්‍රතිභාපූර්ණ සංගීතවේදී, ප්‍රාසාංගික කලාවේදී විශාරද කවීන් රූපසිංහ සමඟයි රසඳුන මේ සොඳුරු කතාබහ.**

ගම්පහ පහළ යාගොඩ ගමේ ඉපදුන කවීන් පාසැල් අධ්‍යාපනය මුලින්ම ලද්දේ ගණේමුල්ල කොස්සින්න ශ්‍රී සීලානන්ද මහා විදුහලෙනි. ඉන් පසු ගම්පහ ශ්‍රී බෝධි ප්‍රාථමික විදුහල, ගම්පහ තක්ෂිලා මහා විදුහල සහ ගම්පහ බණ්ඩාරනායක මහා විදුහලෙන් අධ්‍යාපනය ලද කවීන් කොළඹ සෞන්දර්ය විශ්ව විද්‍යාලයට තේරී පත් වන්නේය.

**● විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ගැන මතක් කළොත්?**

2008 වසරේ පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසුව විශ්ව විද්‍යාලය අධ්‍යාපනය සඳහා කොළඹ සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. එතැනදී උත්තර භාරතීය සංගීත අධ්‍යනාංශයට ඇතුළත්ව, උත්තර භාරතීය ශාස්ත්‍රීය වයලීන් විෂය ප්‍රමුඛ විෂයන් අධ්‍යනය කිරීමෙන් අනතුරුව "ප්‍රාසාංගික කලා වේදී (සංගීතය) විශේෂ උපාධිය" සම්පූර්ණ කළා. ඒ එක්කම මම උතුරු ඉන්දියානු විභාග පාඨමාලාව සම්පූර්ණ කරමින් "විශාරද" පදවිය ද, සංගීත වාදනය - වයලීන් විෂයට අදාලව ලබා ගෙන තියෙනවා.

ටෙලි නාට්‍ය, චිත්‍රපට සංගීත නිර්මාණකරණයට යොමුවීමට කැමැත්තෙන් ඉන්නවා

**● ඔබ පාසලේදීත් කලා අංශයෙන් කැපී පෙනෙන ශිෂ්‍යයෙක් ද?**

පාසල් කාලයේ මුල් අවධියේදී, ඒ කියන්නේ 6 වසරේ සිට 10 වසර දක්වා පමණ මම බොහෝ සෙයින්ම සංගීත විෂයට වඩා ක්‍රීඩා කටයුතු වලට තමයි වැඩි නැඹුරුවක් තිබුණේ. ඒ කාලය තුළ පාසලේ ක්‍රීඩා නායකයා ලෙසත්, ක්‍රිකට් කණ්ඩායමේ නායකා විදියටත් කටයුතු කළා. ඒ වගේම 2002 වසරේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රිකට් හොඳම පිතිකරු වශයෙනුත් තේරී පත්වුණා. පාසල් කාලය තුළදී සංගීත විෂයට අදාලව පැවති සමස්ත ලංකා සංගීත තරග, බස්නාහිර පළාත් සංගීත තරග, ගම්පහ දිස්ත්‍රික් සංගීත තරග ආදියට සහභාගී වී ජයග්‍රහණය රැසක් හිමි කර ගැනීමට අවස්ථාව ලැබුණා. 2003 වසරේ දී පාසලේ පැවති කලා උලෙළේ දී එම වසරේ දක්ෂතම වයලීන් වාදකයා ලෙස ද සම්මාන හිමි කරගත්තා.

**● කොහොමද සංගීතයට නැඹුරු වෙන්නේ?**

පාසලේ විෂයක් වශයෙන් සංගීත විෂය හැදෑරීමට පෙළඹවීම ඇති වන්නේ මගෙ මාමාගේ මඟ පෙන්වීම අනුවයි. ඔහු නමින් ජයසේකර මල්ලවආරච්චි. මේ වන විට විශ්‍රාමික සංගීත ගුරුවරයෙක්. සංගීත විෂය ඉගෙනීමටත්, වයලීන් වාදනය විෂය හැදෑරීමටත් අත්පොත් තබන්නේ එතුමාගෙන්. ඒ වගේම මම මේක අවස්ථාවක් කර ගන්නවා පාසල තුළදී මෙන්ම විශ්ව විද්‍යාලය තුළදීත්, සංගීත විෂයෙන් මා පෝෂණය කළ සෑම ගුරු මවුපියවරුන්වත් ඉතාමත් ආදරයෙන් මතක් කරන්න.

**● මුලින්ම සංගීතවත් කරපු ගීතය මොකක්ද?**

මම මුලින්ම තනුව හා සංගීතය නිර්මාණය කල ගීතය තමයි "හවින් හවේ උතුම් ආදරෙන්" කියන ගීතය. මෙම ගීතය පාසල් සමයේදී නිර්මාණය කල ගීතයක්. නමුත් පටිගත කිරීමට බොහෝ කාලයක් ගත වුණා. පසුව අහම්බෙන් වගේ 2012 වසරේදී මම විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ අධ්‍යාපනය ලබන සමයේදී , විශ්ව විද්‍යාලයේ මගේ මිතුරියක් වූ අපේක්ෂා ලෝචනී සොයුරියට රාජ්‍ය සංගීත සම්මාන උළෙල සඳහා ඉදිරිපත් කිරීමට ගීතයක් නිර්මාණය කරදෙන මෙන් ඇය විසින්ම පදරචනය කරන ලද ගී පද පෙළක් මා වෙත ලබා දුන්නා. එම පද රචනයට තනුව හා සංගීතය මා විසින් නිර්මාණය කර විශ්වවිද්‍යාලය තුළදීම සංගීත පටිගත කිරීම සිදු කෙරුණා. "සසර සුවඳ" නමින් හැඳින්වුණු එම ගීතය තමයි ප්‍රථමයෙන්ම තනුව හා සංගීතය නිර්මාණය කරමින්, සංගීතය හා හඬ පටිගත කරන ලද මා නිර්මාණය කළ ගීතය.



**● මේ වෙද්දී ඔබ ගීත කීයක් නිර්මාණය කරලා තියෙනවා ද ?**

මේ වන විට ගීත නිර්මාණ 92 සඳහා තනු හා සංගීතය නිර්මාණය කරලා තියෙනවා. එම ගීත අතර ප්‍රවීණ ගායක ගායිකාවන් වන ගායක ගායිකාවන් ගයන ගීතත් නිර්මාණය කරලා තියෙනවා. ඒ හැරුණම හරවත් ගී පදරචනා නිර්මාණය කරන ප්‍රවීණමෙන්ම, නවක ගීපද රචකයින් බොහෝ පිරිසක් සමඟත් නව ගී නිර්මාණය කිරීමට අවස්ථාව ලැබුණා. ඔවුන් සියළු දෙනාවත්, සංගීත පටිගත කිරීම් ආරම්භයේ සිටම මාගේ නිර්මාණ සඳහා සංගීත භාණ්ඩ වාදනයෙන් දායක වූ ප්‍රවීණ, නවක සෑම වාද්‍යය ශිල්පී ශිල්පිනියන් සියළු දෙනාමත්, සංගීත පටිගත කිරීමේ හා නාද සංකලනය කිරීමේ ශිල්පීන් සැමත් ඉතා ආදරයෙන් මේ අවස්ථාවේ මතක් කරනවා.

**● ගායනය පැත්තට උනන්දුවක් නැත්ද?**

මුල් අවධියේදී සිටම මම ගොඩක් ප්‍රිය කළේ වයලීන් වාදකයෙක් විදියට නිර්මාණ සඳහා දායකත්වය ලබාදෙන්න. ගීත ගායනයට එතරම් ප්‍රියතාවයක් නැහැ. නමුත් පසුකාලීනව වයලීන වාදනයත් ක්‍රමයෙන් මඟහැරී සංගීත නිර්මාණකරණයට වැඩි නැඹුරුවක් ඇති වුණා.

**● ඔබ වෘත්තීය මට්ටමින් ද සංගීතය කරන්නේ?**

ඇත්තටම නැහැ. මම වෘත්තීය වශයෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීවරයෙකු ලෙස සේවය කරනවා. මම සංගීත නිර්මාණකරණයේ යෙදිලා ඉන්නේ හේතු 2ක් නිසා. එකක් තමයි මම අධ්‍යාපනය ලැබූ විෂය ක්ෂේත්‍රය තුළින් ලබාගත් දැනුම හා ශිල්පීය කුසලතා උපයෝගී කරගනිමින්, මට හැකි අයුරින් පවතින සුභාවිත ගීත කලාව පෝෂණය කිරීමට. මම සංගීතය කරන්නේ මගෙ ආත්ම තෘප්තිය වෙනුවෙන්.

**● ඔබේ නිර්මාණ වලට ඇගයුම් ලැබුණු අවස්ථා මතක් කළොත්**

2014 රාජ්‍ය සංගීත සම්මාන උලෙළේ දී මා විසින් තනුව හා සංගීතය නිර්මාණය කල "ධා ප්‍රේම රැගුම් රඟනා" ගීතය එම වසරේ ප්‍රශස්ථතම ගායනය පිරිමි (නවක) තරග අංශයෙන් නිර්දේශිත නාම ත්‍රිත්වය අතරට පත් වුණා. එම ගීතය ගායනය දිනේද්‍ර ජයවීර බණ්ඩාර විසින් සහ පදරචනය ලහිරු ඉරන්ත සොයුරාගේ. එමෙන්ම 2015 රාජ්‍ය සංගීත සම්මාන උලෙළේ දී මා විසින් තනුව හා සංගීතය නිර්මාණය කල "සඳ ගඟ දිගේ" ගීතය එම වසරේ ප්‍රශස්තතම ගායනය පිරිමි (නවක) තරග අංශයෙන් නිර්දේශිත නාම ත්‍රිත්වය අතරට පත් වුණා. එම ගීතය ගායනය දිනේද්‍ර ජයවීර බණ්ඩාර. ගීතයේ පදරචනය ශාන්ත කුමාර විතාන. ඒ එක්කම 2016 රාජ්‍ය සංගීත සම්මාන උළෙලට සමගාමීව පැවති "සුභාවිත ගීත නිර්මාණය" යන වැඩමුළුවට ද මට සහභාගී වීමට අවස්ථාව ලැබුණා.

**● ඉදිරි අරමුණු බලාපොරොත්තු මොනවාද ?**

මට ඉදිරි අරමුණු බලාපොරොත්තු කියලා ලොකු දේවල් නැහැ. මනුෂ්‍යයෙක් විදියට සරලව සතුටින්, කිසිවෙකුටවත් කරදරයක් නොවී ජීවත් වීම තමයි ගොඩක්ම බලාපොරොත්තු වෙන්නේ. ඒ වගේම සංගීත ක්ෂේත්‍රය තුළ, සරල ගී නිර්මාණ කරණයෙන් ඔබ්බට ගොස් ටෙලි නාට්‍ය, චිත්‍රපට සංගීත නිර්මාණකරණයට සහ චිත්‍රපට සංගීත නිර්මාණකරණයට යොමුවීමට කැමැත්තක් සහ බලාපොරොත්තුවක් තිබෙනවා.









**රොහාන් අයියාගෙන් මගේ ක්‍රීඩා ජීවිතයට ලැබෙන්නේ පුදුමාකාර සහයෝගයක්**

# එයා මගේ සෙවණැල්ල වගේ පස්සෙන් ඉන්නවා

► ෆවුස් මොහොමඩ්

**එකට පියාඹන්නේ එක හා සමාන අත්තටු ඇති කුරුල්ලෝය. දෙහදක් එක් වන්නේ සිතුම් පැතුම් එක හා සමාන වන විටදීය. සිතුම් පැතුම් පමණක් නොව දෙදෙනා අතර පවතින අවබෝධයත් ප්‍රේමය මෙන්ම විවාහයත් සාර්ථක වීමට හේතුවයි. මේස පන්දු ක්‍රීඩාවෙන් රටක් දිනූ හිටපු ජාතික ශූර රොහාන් සිරිසේනත්, ජාතික ශූරිය ඉෂාරා මධුරංගිත් යුග දිවියට පිවිසියේ එය හරි අපූරුවට ගැළපීම නිසාය.**

අවුරුදු 7ක්ම එක දිගට ජාතික ශූරයා ලෙස රොහාන් සිරිසේනත්, අවුරුදු 7ක් ජාතික ශූරිය ලෙස ඉෂාරා මධුරංගිත් ශ්‍රී ලංකාවේ මේසපන්දු ක්‍රීඩාව තනි තනිව දිග්විජය කළා පමණක් නොව දෙදෙනාම එක්ව අවුරුදු 7ක්ම මිශ්‍ර යුගල ජාතික ශූරතාවත් දිනා ගත්හ. එය දැන් දෙදෙනාගේම පෞද්ගලික ජීවිතයත් එකට යා කිරීමට සමත් වී ඇත.

පසුගියදා කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී රොහාන් සහ ඉෂාරා අතිනත ගත්තේ මේස පන්දු ක්‍රීඩාවේ හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ, පුහුණුකරුවන්ගේ හා නිලධාරීන්ගේ සුබපැතුම් මැදිනි. මනාලියගේ පාර්ශ්වයෙන් ජාතික ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායක සහ ජාතික ක්‍රීඩා සභාවේ වත්මන් සභාපති අර්ජුන රණතුංග සහ මනාලයාගේ පාර්ශ්වයෙන් මේසපන්දු සංගමයේ හිටපු උප සභාපතිවරයකු වූ ආචාර්ය ලලිත් ලියනගේ සාක්ෂිකරුවෝ බවට පත් වූ අතර, මෙරට ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ජාතික ශූරයකු හා ජාතික ශූරියක අතිනත ගත් විරල අවස්ථාවක් ඉතිහාසයට එක් විය. රොහාන් - ඉෂාරා නව යුවළ යුග දිවියට පිවිසියද, මේස පන්දුවෙන් ඈත්වීමට නම් ඉඩක් ලැබුණේම නැත.

'මම මුලින්ම ජාතික මේසපන්දු කණ්ඩායමට එක්වෙද්දී එයා කණ්ඩායමේ හිටියා. එයා තමයි නායකයා.' මේ වන විට ජෝර්දානයේ ලෝක ටෙනිස් සම්මේලන මේස පන්දු තරඟාවලියකට සහභාගි වෙමින් සිටින ඉෂාරා 'රසඳුන' සමඟ පිළිසඳරකට එක් වූයේ එලෙසිනි. ඇය ජෝර්දානය බලා පිටත්ව ගියේ විවාහයෙන් දින දෙකකට පසුවය.

2004 වසරේ මුලින්ම ඇය ජාතික ශූරිය බවට පත්වෙද්දී 14 හැවිරිදි වියේ පසු වූ අතර, ඒ වන විට රොහාන් ජාතික මට්ටමේ පළපුරුදු ක්‍රීඩකයකුව සිටියේය. 1996 සිට 2019 දක්වා ජාතික කණ්ඩායම නියෝජනය කළ රොහාන් - ඉෂාරා ප්‍රේමය දළුලන්නට පටන් ගත්තේ මේසපන්දු පිටියේදීමය. මේස පන්දුවත් එක්කම හරි හරියට ප්‍රේමය පමණක් නොව දස්කම් ද මුවහත් විය. එය තවත් ඔප් නැංවුණේ පසුකාලීනව ඉෂාරාගේ පුහුණුකරු ලෙස රොහාන් පත්වීමත් සමඟය.





'කාලයක් තිස්සේ ආදරය කළත්, අන්තිමේදී අපි විවාහ වුණේ ටිකක් හදිස්සියෙන් වගෙයි. අපි ඇත්තටම සැලසුම් කරලා තිබුණේ ලබන මාර්තු මාසයේදී විවාහ උත්සවය ගන්නයි. ඒත් රොහාන් අයියට ඒ කාලෙට නිවාඩු ගන්න බැරි තත්ත්වයක් ඇවිත් තිබුණා. ඒ නිසා ජනවාරි අන්තිමට විවාහ වෙන්න හිතාගෙන හදිසියේම සති දෙකකට ලංකාවට ආවා.' සැලසුම වෙනස් වුණු නිසා ආපහු සැරයක් අලුතින් හැමදේම හිතන්න වුණා. අපි විවාහය සැලසුම් කළේ දවස් දහයක් ඇතුළතයි' ඇය කීවාය.

රොහාන් අමෙරිකාවට ගියේ 2020 වසරේදී ක්‍රීඩාවෙන් සමුගැනීමෙන් වසරක් ගතවෙද්දීය. ක්‍රීඩාවෙන් සමුගත්තත්, ලැබෙන විවේකයේදී අමෙරිකාවේ මේසපන්දු තරගවලට එක්වන බව කියමින් රොහාන් 'රසඳුන' සමඟ කතාබහට එකතු වුණේ නැවත අමෙරිකාව බලා පිටත්ව යෑමට කටුනායක ගුවන්තොටුපොළට ගිය මොහොතේදීය. ඔහුගේ සති දෙකක නිවාඩුව අවසන්වී තිබිණි.

'අපි දෙන්නා මේ දවස්වල වැඩිපුරම අවධානය යොමු කරන්නේ ඉෂාරාගේ ඔලිම්පික් සිහිනය වෙනුවෙන්. ඉෂාරාගේ ලොකුම හීනය ලබන අවුරුද්දේ ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ මේසපන්දු තරග ඉසව්වට සුදුසුකම් ලබන්නයි. එයා ජෝර්දානයේ තරඟාවලියට ගියේ අවශ්‍ය සුදුසුකම් තවදුරටත් එකතු කරගන්නයි.' රොහාන් සඳහන් කළේය.

දශකයකට වැඩි කාලයක් මෙරට මේසපන්දු ක්‍රීඩාවේ නොම්මර එකේ ක්‍රීඩිකාව ලෙස වැජඹුණු ඉෂාරාට ලබන වසරේ ඔලිම්පික් සුදුසුකම් ලැබීමට හැකි නම් එය වාර්තාවකි. ඉතිහාසයේ කිසිම අවස්ථාවක ශ්‍රී ලංකාව මේසපන්දු ක්‍රීඩාවෙන් ඔලිම්පික් සුදුසුකම් ලබා නැත. දැන් රොහාන්ගේ ඉලක්කය සිය බිරියගේ සිහිනය සැබෑ කිරීමය.

අවුරුදු 6ක්ම මෙරට නොම්මර එකේ ක්‍රීඩකයා ලෙස වැජඹුණු රොහාන්ට සිය බිරියගේ දස්කම් මුවහත් කිරීමට අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් එමටය. අමෙරිකාවට ගියද ඇගේ පුහුණුවීම් සඳහා නියමිත කාලසටහන සකස් කර දෙන්නේ රොහාන්ය.

ඔහු ඇගේ පුහුණුකරු ලෙස කටයුතු කරන්නේ දෙදෙනා ශ්‍රී ලංකා ගුවන් හමුදා මේසපන්දු සංචිතයට ඇතුළත්ව සිටි කාලයේ සිටමය. 2009 සිට 2015 දක්වා ගුවන් හමුදා මේසපන්දු කණ්ඩායම නියෝජනය කළ ඉෂාරා සහ රොහාන් ගුවන් හමුදා මේසපන්දු කණ්ඩායමේ නායකයා සහ නායිකාව ලෙස කටයුතු කළ අතර, ජාතික මේස පන්දු කණ්ඩායමේ නායකයා සහ නායිකාව ලෙසත් ජාත්‍යන්තර තරග බිමට එක්වූහ.

විවාහයෙන් දින දෙකකට පසු ඉෂාරා ජෝර්දානයට ගිය අතර, රොහාන්ගේ නිවාඩුවේ ඉතිරි දින කිහිපය ලංකාවේ ගත විය. ඇය නැවත ශ්‍රී ලංකාවට පැමිණියේ 10 වැනිදාය. ඒ වෙද්දී රොහාන් අමෙරිකාවේය. රොහාන්ගේ සහ ඉෂාරාගේ කාර්යබහුල ජීවිතය ගෙවී යන්නේ එලෙසිනි.

'ඇත්තටම රොහාන් අයියාගෙන් මගේ ක්‍රීඩා ජීවිතයට ලැබෙන්නේ පුදුමාකාර සහයෝගයක්. දෙන්නම ක්‍රීඩාවේ නිරතව සිටින නිසා ඒ අවබෝධය ඇති තරම් තියෙනවා. අපි දෙන්නගේම සිතුම් පැතුම් එක හා සමානයි. රොහාන් අයියා වගේ කෙනෙක් එක්ක විවාහ වෙන්න ලැබීම ගැන මට හරි සතුටුයි. එයා මගේ හෙවණැල්ල වගේ පස්සෙන් ඉන්නවා.' ඉෂාරා එසේ කියන්නේ හදපිරි සතුටිනි.



**මම මුලින්ම ජාතික මේස පන්දු කණ්ඩායමට එක්වෙද්දී ඔහු තමයි කණ්ඩායමේ නායකයා**







# ඉන්දියානු තරුණියන්ගේ සිහින කුමරා සිද්ධාර්ත්

## සුපිරි නිළි කීරා සමඟ අතිනත ගනී...

▶ ඉන්දික ගමගේ

**කඩවසම් සිද්ධාර්ත් මල්හෝත්‍රාගේ අත ගන්නට බලා සිටි ඉන්දියානු තරුණියන්ගේ සිහින පහුගිය සතියේ හදිසියේම සුනු විසුනු වී ගියා. ඒ 38 හැවිරිදි සුපිරි නළුවාගේ හදිසි විවාහය නිසා. ලෝකයට මෙය එක්තරා විදියක හදිසි විවාහයක් වුණත් සිද්ධාර්ත් තම විවාහය ප්ලෑන් කළේ මාස 6ක විතර කාලයක සිට. සුරූපී නිළි කීරා අද්වානි සමඟින් සිද්ධාර්ත් අතිනත ගැනීම සිදුවුණේ පසුගිය 7 වැනිදා. ඒ රාජස්තානයේදී.**

සිද්ධාර්ත් මුලින්ම සිනමාවට පිවිසුණේ කරන් ජෝහාර්ගේ My Name is Khan චිත්‍රපටයේ සහාය අධ්‍යක්ෂකවරයා විදියට 2010දී. තවත් අවුරුදු දෙකකට පස්සේ ඔහු මුළු ඉන්දියාවම අඳුන ගත්තෙ Student of The Year චිත්‍රපටයේ අභිමන්යු විදියට. පස්සේ කාලෙකදී තවත් සුපිරි තරු දෙකක් විදියට අභිෂේක ලබපු වරුන් ධවාන් වගේම ආලියා භාත්ගේත් පළමු සිනමා රංගනය Student of The Year වීම තමයි විශේෂත්වය.



දශකයක රංගන ජීවිතයේ සාර්ථක රංගන ශිල්පියෙක් විදියට වැඩ පෙන්වපු සිද්ධාර්ත්ට 2021 වසරේ තිරගත වුණු Shershaah චිත්‍රපටය ඉතාම වැදගත් වුණේ හේතු දෙකක් නිසා. ඒ එහි කරපු රංගනය වෙනුවෙන් හොඳම නළුවා විදියට නාම යෝජනා ලැබීම නිසා. ඒ වගේම එම චිත්‍රපටියේ රූගත කිරීම් අතරේ එහි ප්‍රධාන නිළිය වුණු කීරා සමඟ ඇතිවුණු ප්‍රේම සම්බන්ඳය නිසා.


සිද්ධාර්ත්ට වඩා අවුරුදු 7කින් බාල කීරා අද්වානි බොලිවුඩ් සිනමාවේ ජනප්‍රිය නිළියක්. ඇය මුලින්ම ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය වුණේ M. S දෝනිගේ බිරිය විදියට. ඒ M. S. Dhoni ගේ The Untold Story චිත්‍රපටයේ. 2019 වසරේ IIFA හොඳම සහය නිළිය වුණත් කීරාගේ ජීවිතයේ මේ දක්වා වැදගත්ම සිනමාපටය තමයි Shershaah. ඒ ඇය සිද්ධාර්ත් එක්ක පටන්ගත්ත ආදර සම්බන්ධය නිසා විතරක් නෙවෙයි, ඒ චිත්‍රපටයේ ඇගේ රංගනය වෙනුවෙන් ෆිල්ම්ෆෙයාර් හොඳම නිළිය විදියට නාම යෝජනා ලැබීමත් නිසා.

සිද්ධාර්ත් - කීරා දෙදෙනාම ඉතාම සාර්ථකව තමන්ගේ සම්බන්ධය ලෝකෙට රහසක් විදියට තියාගත්තත් එය රහසක් නොවුයේ කරන් ජොහාර් සහ ෂහිඩ් කපූර් දෙන්නා නිසයි. බොලිවුඩයේ රහස්, අප්‍රකට සම්බන්ධ මේ හැම දේම ගැන හොඳටම ඇහැ ගහගෙන ඉන්න කරන් තමන්ගේ සුප්‍රකට Koffee With Karan වැඩසටහනේදී තමයි මේ කතාව මුලින්ම හෙළිදරවු කළේ. 'ඔව් අපි දෙන්නා අතරේ යමක් තියෙනවා හැබැයි ඔය කියන වගේ එකක් නෙවේ ' වගේ එකක් කියල කීරා ලිස්සලා යන්න හදත්දී ඒ වැඩසටහනේ අනික් ආරාධිතයා වුණු ෂයිඩ් කපූර්ගේ කටට බ්‍රේක් නැති වීම නිසා තමයි මුළු ඉන්දියාවම ඒ ගැන දැනගත්තේ. සමහරු කියන්නේ නම් මේක කරන් - සහිඩ් දෙන්නගේ ප්ලෑන් එකක් කියලයි.

කොහොම වුණත් මේ සම්බන්දෙ මුලින්ම පටන් අරගෙන තියෙන්නේ 2018 කියලත් දැන් එළිවෙලා තියෙනවා. Lust Stories චිත්‍රපටියේ අවසාන රූගත කිරීම් දවසේ සාදයේදී තමයි දෙන්නා මුලින්ම හමුවුණේ කියල කීරා පහුගිය දවසක කියා තිබුණා. 'ඒ රාත්‍රිය මගේ ජීවිතයේ විශේෂ රාත්‍රියක්' ඇය සිද්ධාර්ත්ගේ ඇස් දෙක දිහා බලාගෙනම එහෙම පැවසුව බවත් ඉන්දියානු මාධ්‍ය වාර්තා කරලා තියෙනවා. Shershaah චිත්‍රපටියේ සාර්ථකත්වය නිසා මේ දෙන්නා "හොඳට කැපෙන ජෝඩුවක්" විදියට ඉන්දියානු මාධ්‍ය විසිනුත් හඳුන්වලා දුන්න බවත් ප්‍රකටයි. පස්සේ පස්සේ මේ දෙන්නත් විවිධ රටවල ගිහින් ආදර නිවාඩු ගත කරපු බවට ඔවුන්ගේම INSTAGRAM ගිණුම්වල සාක්ෂිත් ඕන තරම් තියෙනවා.

කොහොමහරි පසුගිය 7 වැනිදා පවත්වපු මේ වසරේ බොලිවුඩයේ පළවෙනි නළු - නිළි විවාහයට දෙපාර්ශ්වයෙන්ම විශාල පිරිසක් සහභාගී වුණා. කරන් ජොහාර්, වරුන් ධවාන්, අනිල් කපූර්, සහිඩ් කපූර්, රෝහිත් ශෙට්ටි ඇතුළු ජනප්‍රිය බොලිවුඩ් තරු වගේම බිලියනපති අම්බානිගේ පුත්‍රයා වන අකාෂ් අම්බානිටත් ඒ අතරේ විශේෂ තැනක් හිමි වුණා. මුල ඉඳන්ම මේ සම්බන්ධෙට පොහොර දාපු කරන්, සහිඩ් දෙන්න විවාහයට දවස් කීපෙකට කලින් ඉඳලම රාජස්තානේට ගිය බවත් ඉන්දියාවේ පැපරාසි මාධ්‍ය වාර්තා කරලා තියෙනවා.

විවාහය වෙනුවෙන් ජනප්‍රිය ඇඳුම් නිර්මාණකරු මනිෂ් මල්හෝත්‍රා විසින් අති විශේෂ ඇඳුම් 150ක් නිර්මාණය කළ බවත් පැවසුණා. විවාහයෙන් පස්සේ සිද්ධාර්ත් - කීරා පදිංචි වෙන්න විශේෂ නිවසක් සිද්ධාර්ත් විසින් හොයල තියෙන්නේ මීට මාස 6කට විතර කලින් ඉඳලලු. අන්තිමට තමන් හොයපු විදියෙම නිවසක් ජුහුවලින් ගන්නත් මේ දෙන්නට පුළුවන් වෙලා තියෙනවා. නිවෙස වෙනුවෙන් ඔවුන් ගෙවූ මුදල ඉන්දියානු රුපියල් කෝටි 70කි. කෙසේ වෙතත් විවාහයෙන් පස්සේ මේ දෙන්න මුලින්ම යන්නේ සිද්ධාර්ත්ගේ පාලි හිල් වල මුහුදට මුහුණලෑ තියෙන සුඛෝපභෝගී නිවසට බව තමයි ආරංචි වෙන්නේ.



වර්ෂ 2023ක් වූ පෙබරවාරි මස 12 වැනිදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.